# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 14,561—1965 නොවැම්බර් 19 වැනි සිකුරාදා—1965.11.19

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV වැනි කොටස—පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට, වෙන වෙනම පිටු අංක යොද ඇත.)


| | පිට | | පිට |
|---|---|---|---|
| පළාත් පාලන නිවේදන .. .. .. | 895 | ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන .. .. .. | 900 |
| තනතුරු—ඇබෑර්තු .. .. .. .. | 897 | අය-වැය ලේඛන .. .. .. | 902 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය .. .. .. | — | දේපළ විකිණීම . .. .. | — |
| අතුරු ව්‍යවස්ථා .. . . .. | 900 | මාර්ග කොමිටි දැන්වීම .. .. .. | — |
| පළාත් පාලන සභා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම .. | — | විවිධ දැන්වීම් .. .. .. | 913 |


## පළාත් පාලන නිවේදන

### පළාත් පාලන (පාලන කොට්ඨාශ පිළිබඳ) ආඥාපනත
### (265 වැනි අධිකාරය)

නුවරඑළිය (පහළ) කොට්ඨාශයේ පළාත් පාලන සහකාර කොමසාරිස් වශයෙන් ලංකා පරිපාලන සේවයේ බී. ඒ. ජේ. කාසිනාදර් මහතා 1965 නොවැම්බර් 1 වැනි දින සිට පත් කර ඇති බැව් මහජනයාගේ දැනගැනීමට මෙයින් දන්වා සිටිනු ලැබේ.

ඩබ්ලිව්. ජේ. ප්‍රනාන්දු,
පළාත් පාලන කොමසාරිස්.

1965 නොවැම්බර් මස 11 වැනි දින,
කොළඹ දී ය.

11-790—65.11.19 දින අංක 14,561 දරන ගැසට් පත්‍රය.

---

ඇල්.සී.—බී. 22/53—ප.පා.දෙ.—බී.සී. 692.

### කඳාන සුළු නගර සභාව

#### විදුලි බල පනත

ඉඩම්, වාරිමාර්ග සහ විදුලි බලය පිළිබඳ ඇමතිවරයාගෙන් විමසා, පළාත් පාලන ඇමතිවරයා විසින් දෙන ලද අනුමැතිය ඇති ව, කඳාන සුළු නගර සභාව විසින් (205 වැනි අධිකාරය වන) විදුලි බල පනතේ 46 වන වගන්තිය යටතේ සම්පාදිත වූ නියෝග.

ඒ. ටී. ගොඩ්‍රේලි මොරගොඩ,
පළාත් පාලන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1965.10.31,
කොළඹ දීය.

#### නියෝග

1. මේ නියෝගවල—

"පනත" යනුවෙන් (205 වැනි අධිකාරය වන) විදුලි බල පනත අදහස් කරනු ලැබේ.

"බලපත්‍රය" යනුවෙන් පනතේ 2 වන වගන්තිය යටතේ, බලපත්‍රලාභියා වෙත නිකුත් කරන ලද බලපත්‍රය අදහස් කරනු ලැබේ.

"බලපත්‍රලාභියා" යනුවෙන් කඳාන සුළු නගර සභාව අදහස් කරනු ලැබේ.

"අධිකාරි" යනුවෙන් කඳාන සුළු නගර සභාවේ විදුලි දෙපාර්තමේන්තුවෙහි විදුලි අධිකාරි අදහස් කරනු ලැබේ.

2. තම ප්‍රයෝජනය පිණිස බලපත්‍රලාභියාගෙන් විදුලි බලය ලබාගැනීමට බලාපොරොත්තු වන යම් කෙනකු විසින්—

(අ) විදුලි බලය ලබාගැනීමට ඕනෑ කරන දිනට යටත් පිරිසෙයින් දවස් දහහතරකට මත්තෙන්, ඒ සඳහා බලපත්‍රලාභියා විසින් සපයනු ලබන ආකෘති පත්‍රයෙහි පිළියෙළ කළ ඉල්ලුම් පත්‍රයක් බලපත්‍රලාභියා වෙත ඉදිරිපත් කළ යුතු ය; තවද

(ආ) විද්‍යුත් වේගවාහක කම්බිය සඳහා ගාස්තු බලපත්‍රලාභියා වෙත කලින් ගෙවිය යුතු ය, නැතහොත් බලපත්‍රලාභියාට අවශ්‍ය වන්නේ නම්, පනතේ 31 වන වගන්තිය යටතේ බලපත්‍රලාභියා සමග ලියවිල්ලකින් වූ ගිවිසුමකට ඇතුළත් විය යුතු ය.

3. විදුලි බලය පාවිච්චි කරන සෑම පාරිභෝගිකයකු විසින් ම බලපත්‍රයේ සඳහන් කරන ලද ප්‍රමාණයන්ට අනු ව ඒ විදුලි බලය සඳහා මුදල් ගෙවිය යුතු ය.

කොට ඇත්තාවූ සෑම බඳවා ගැනීමේ ක්‍රියා පටිපාටියකදීම සිංහල මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ සිංහලයෙකු වන අයදුම්කරුවකුට ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් ලබන ලද සිංහල භාෂාව පිළිබඳ හෝ ඊට සමාන විෂයකින් සාමාර්ථයක් තිබිය යුතුය.

(1963 පෙබරවාරි මස 8 වැනි දිනට පූර්ව වූ දිනයක සිට පළාත් පාලන සේවයේ සිටියා වූත්, පළාත් පාලන සේවයේ වෙනත් තනතුරු ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් කෙරෙහි මේ අවශ්‍යතාව අදාළ නොවේ.)

(ආ) කාර්යක්ෂමතා කඩඉම.—පත්වීම ස්ථිර කරන ලද දිනයේ සිට අවුරුදු 2 ක් ඇතුළතදී ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර තත්ත්වයේ සිංහල භාෂාව පිළිබඳ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයකින් සමත් වන ලෙස නව ප්‍රවේශක නිලධාරීන්ට නියම කරනු ලැබිය හැකිය. මේ පරීක්ෂණයෙන් සමත් වීමට අපොහොසත් වීමේ ප්‍රතිඵලය වනුයේ වැටුප් වැඩිවීම් කල් දැමීමය.

(iv) පළාත් පාලන සේවයට ඇතුළුවීම සඳහා සිංහල මාධ්‍යයෙන් සුදුසුකම් ලබා ගන්නා "නව ප්‍රවේශක නිලධාරීහු" සිංහල පිළිබඳ ප්‍රවීණතා පරීක්ෂණයෙන් නිදහස් කරනු ලැබෙති.

(v) ආධුනික සේවා කාලය/වැඩ පරීක්ෂා කාලය අවසානයේදී සිංහල ප්‍රවීණතාව පිළිබඳ නියමිත තත්ත්වයට පැමිණිය නොහැකි වුවහොත් අංක 21 සහ 22 දරණ පළාත් පාලන සේවා රෙගුලාසිවල සාමාන්‍ය විධිවිධාන බලපවත්වනු ඇත.

(ඉහත සඳහන් (iii) (අ), (ආ) සහ (v) දරන කොන්දේසි දෙමළ/ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් සේවයට බඳවා ගනු ලැබූවන් කෙරෙහි යෙදේ.)

සටහන.—මේ කරුණ සම්බන්ධයෙන් "නව ප්‍රවේශක නිලධාරි" යන පදයෙන් අදහස් කරන්නේ 1960 ජනවාරි 29 වැනි දින හෝ ඊට පසුව ප්‍රසිද්ධ කරනු ලබන දැන්වීම්වලට අනුකූලව පළාත් පාලන සේවා තනතුරුවලට පත්කර ගනු ලබන නිලධාරීන්ය.

5. අවශ්‍ය සුදුසුකම්.—සෑම අයදුම්කරුවකු විසින්ම, තමා ලාංකික යකු බවට සැහෙන සාක්ෂ්‍ය ඉදිරිපත් කළ යුතු ය. පළාත් පාලන සේවයට බඳවා ගැනීම් සම්බන්ධ සියලුම කටයුතු සඳහා "ලාංකික" යන වචනයෙන් අදහස් කෙරෙනුයේ පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ රටවැසියෙකු වූවෙකි.

6. සේවා මුක්ත භටයින් සඳහා අනුග්‍රහ.—(අ) සේවා මුක්ත වූ අයදුම්කරුවනට, ඔවුන්ගේ නිත්‍ය භට හමුදා සේවා කාලය, තම වයසින් අඩුකර ගැනීමෙන්, ඉල්ලුම් කර ඇති තනතුරුවලට නියමිත උපරිම වයස් සීමාව ඇතුළතට පැමිණිය හැකිවන අවස්ථාවක නිත්‍ය භට සේවා කාලපරිච්ඡේදය එසේ අඩුකර ගැනීමට ඉඩ දෙනු ලැබේ.

(ආ) සේවයේ යම්කිසි තනතුරක් සඳහා බඳවා ගැනීමේ ක්‍රියා පටිපාටියෙහි නියමිත අවම අධ්‍යාපන සුදුසුකම් ඊළඟට පහළින් ඇති විභාගය දක්වා අඩු කිරීමට සේවා මුක්තයන් වන අයදුම්කරුවනට අවසර දෙනු ලැබේ.

7. වයස පිළිබඳ අනුග්‍රහය.—පළාත් පාලන සේවයේ තනතුරු සම්බන්ධයෙන් පළ කෙරෙන පුරප්පාඩු සඳහා වයස් සීමාවන් ගැන නොතකා ම අයදුම්පත් එවීමට පළාත් පාලන සේවා සාමාජිකයන්ට පුළුවන.

8. වෙනත් අවශ්‍ය කරුණු.—(i) දැනට පළාත් පාලන මණ්ඩලයක සේවයේ යෙදී සිටින නිලධාරීන් අයදුම්පත් තම තමන් සේවය කරන ප්‍රාදේශීය බලමණ්ඩලයේ සභාපති මඟින් හෝ නාගරික කොමසාරිස්වරයා මඟින් හෝ ඉදිරිපත් කළ යුතුයි.

(ii) දැනට ආණ්ඩුවේ සේවයෙහි යෙදී සිටින නිලධාරීන්ගේ අයදුම්පත් ඉදිරිපත් කළ යුත්තේ ස්වකීය දෙපාර්තමේන්තුවල ප්‍රධානයන්ගේ මාර්ගයෙනි. ආණ්ඩුවේ සේවයෙහි ස්ථිර තනතුරු දරණ නිලධාරීන් එවන අයදුම්පත් ඉදිරිපත් කිරීමේ දී, ඒ ඒ දෙපාර්තමේන්තුවල ප්‍රධානයන් විසින්ම එම අයදුම්කරුවන් තෝරාගනු ලැබුව හොත් ඔවුන් ස්වකීය තනතුරුවලින් මුදාහරින්නට තමන් සූදානමව සිටිත් ද නැත් දැයි සඳහන් කළ යුතුය.

(iii) සම්මුඛ පරීක්ෂණයක් හෝ ලිඛිත පරීක්ෂණයක් සඳහා නියමිත වේලාවක, දන්වනු ලබන ස්ථානයකට පැමිණෙන ලෙස අපේක්ෂකයන්ට නියම කරනු ලැබිය හැකි ය. මේ සම්බන්ධයෙන් කිසිම ගමන් වියදමක් හෝ අන්කිසි වියදමක් හෝ ගෙවනු නොලැබේ.

(iv) කිසිම අපේක්ෂකයකු ගැන නිර්දේශයක් කිරීමට යම් තැනැත්තකුට වුවමනා නම් ඔහු එසේ කළ යුත්තේ එම අපේක්ෂකයාට සහතික පත්‍රයක් දීමෙනි. යම් අපේක්ෂකයකු තෝරා ගැනීම සම්බන්ධයෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයක් ලබා ගැනීමකට හෝ බල පැවැත්වීමකට හෝ උත්සාහයක් දරනු ලැබුවහොත් ඒ හේතුවෙන් ඒ අපේක්ෂකයා නුසුදුසු බවට පත්වන්නේ ය.

(v) යම් අයදුම්කරුවකුගේ අයදුම්පතෙහි යම් කිසි අසත්‍ය තොරතුරක් සඳහන් කොට තිබෙන බව පසු තෝරාගැනීමට කලින් දැනගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් රාජකාර්යයෙන් පහ කරනු ලැබීමටත් ඉඩ තිබේ.

(vi) මේ දැන්වීමේ සඳහන් නියමයන්ට කවර ලෙසකින් වුවත් නොගැළපෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(vii) අයදුම්පත් මනාගි මීට යාකොට ඇති ආකෘතියට අනුව සාරානුකූලව පිළියෙල කොට, පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති වෙත (ඔහුගේ පෞද්ගලික නමට නොවේ) එවිය යුතුයි.

(viii) අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනයෙන් පසු මේ කාර්යාලයට ලැබෙන අයදුම් පත් සාමාන්‍යයෙන් සලකා බලනු නොලැබේ. අයදුම් පතක් තැපැලේදී ප්‍රමාද වූ බවට හෝ නැති වූ බවට කෙරෙන කිසිම පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ. අවසාන දිනය වනතුරු ස්වකීය අයදුම් පත් ඉදිරිපත් කිරීම ප්‍රමාද කරන අයදුම්කරුවෝ තුමූම ඒ අවදානමට මුහුණ පාති.

## අන්‍යාකාරයකින් සඳහන් කොට නැති කල්හි භාවිත කළ යුතු අයදුම්පත් ආකෘතිය

### පළාත් පාලන සේවය

සැ. යු.—(i) අයදුම්පත්‍ර මෙහි පහත සඳහන් ආකෘතියෙහි පිළියෙල කොට, තනතුර අදාළ වන ගැසට් නිවේදනයෙහි සඳහන් අයදුම්පත්‍ර භාර ගන්නා අවසාන දින හෝ ඊට පළමු කොළඹ 1, තැ. පෙ. 530, පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති වෙත ලැබෙන්නට එවිය යුතුයි. අයදුම්පත්‍ර සභාපතිගේ පෞද්ගලික නමට නොඑවිය යුතුයි.

(ii) තනතුරු ඉල්ලා සිටීම සඳහා තමා සාකල්‍යයෙන්ම සුදුසු බැව් නිශ්චය කරගනු පිණිස, තම අයදුම්පත්‍ර පිළියෙල කිරීමට පළමු ඉහත සඳහන් සාමාන්‍ය කොන්දේසි හා ගැසට් නිවේදනයේ අවශ්‍යතාද සැලකිල්ලෙන් කියවා බලන ලෙස අයදුම්කරුවන්ට අවවාද කරනු ලැබේ. ගැසට් නිවේදනය බලා අදාළ සියලුම තොරතුරු සැපයීමට අයදුම්කරුවෝ වග බලා ගත යුතුය.

(iii) පහත සඳහන් ලේඛනවල පිටපත්, අයදුම්කරුවෝ ස්වකීය අයදුම්පත්‍රවලට ඇමිණිය යුතුය. (1) ඉංග්‍රීසි-සිංහල, දෙමළ යන භාෂාවලින් සමත් වී ඇති උසස්ම විභාගය පිළිබඳ සහතිකය, (2) චරිත සහතිකය, (3) ඉල්ලා සිටින තනතුර සම්බන්ධයෙන් අදාළ වෙනම වෘත්තීය/ශිල්පීය සුදුසුකම් පිළිබඳ සහතිකය.

(iv) ඉහත සඳහන් සාමාන්‍ය කොන්දේසිවල 8 වැනි ඡේදය කෙරෙහි විශේෂ සැලකිල්ල යොමු කරන්න.

——— තනතුර සඳහාවූ අයදුම්පතයි

1. (අ) පුරප්පාඩුව ප්‍රසිද්ධකොට ඇති ගැසට් පත්‍රයේ දිනය : ———.

(ආ) ඉල්ලුම් කර සිටින තනතුර :———.

2. සම්පූර්ණ නම පැහැදිලි අකුරෙන් :———.

ජාතිය :———.

(එම ලියාපදිංචි වීමෙන් ලාංකිකයකු වී නම් පුරවැසි භාවය පිළිබඳ සහතිකයේ දිනයත් සැඳහුම් අංකයත් සඳහන් කරන්න)

3. තැපැල් ලිපිනය :———.
(ලිපිනය වෙනස් වූ වහාම ඒ බව දන්වා එවිය යුතුයි.)

4. (අ) අයදුම්පත්‍ර භාරගන්නා අවසාන දිනයට නියම වයස : අවුරුදු——, මාස——, දින——.

(ආ) උපන් දිනය :———.

| අවුරුද්ද | මාසය | දිනය |
|---|---|---|
| | | |

5. උපන් ස්ථානය :—

(අ) අයදුම්කරු :———.

(ආ) අයදුම්කරුගේ පියා :———.

(ඇ) අයදුම්කරුගේ පියාගේ පියා :———.

(ඈ) අයදුම්කරුගේ පිය පස මුත්තා :———.
(අයදුම්කරු ලංකාවේ උපත් කෙනෙක් නම් (අ) පමණක් නොව (ආ) හෝ (ඇ) (ඈ) යන දෙකම හෝ පිරවිය යුතුයි. ඔහු ලංකාවේ නුපන් කෙනෙක් නම් (අ) පමණක් නොව (ආ) සහ (ඇ) හෝ (ඈ) සහ (ඉ) හෝ පිරවිය යුතුයි.)

6. විවාහකද? අවිවාහකද? වැන්දඹුද? :———.

7. වයස අවුරුදු 12 සිට ඉගෙන ගත් පාඨශාලා, විද්‍යාල සහ අනිකුත් ආයතන :—

සාමාන්‍ය අධ්‍යාපනය

| පාඨශාලාව හෝ විද්‍යාලය | සිට | දක්වා |
|---|---|---|
| 1. | | |
| 2. | | |
| 3. | | |
| 4. | | |
| 5. | | |

වෘත්තිය/ශිල්පීය අධ්‍යාපනය

| විද්‍යායතනය | සිට | දක්වා |
|---|---|---|
| 1. | | |
| 2. | | |
| 3. | | |
| 4. | | |
| 5. | | |

8. අධ්‍යාපන සුදුසුකම් හා අන්තිමට සමත් වූ විභාගය දිනයත් සමඟ :—

(අ) සිංහල :———.

(ආ) ඉංග්‍රීසි :———.

(ඇ) දෙමළ :———.

9. ලබාගෙන ඇති වෘත්තිය සහ හෝ ශිල්පීය සුදුසුකම්, ලැබූ දින හා ආයතනවල නම් :———.

10. ඉගෙනගත් පාඨශාලාව හා එයින් අස්වූ දිනය :———,

11. (අ) පාඨශාලාවෙන් අස්වූ දින සිට කළ රක්‍ෂා (පත් වූ දිනයත් හා අස්වූ දිනයත් දක්වමින් දැරූ තනතුරු සඳහන් කරන්න) :———.

(ආ) මීට පළමු ආණ්ඩුව යටතේ හෝ පළාත් පාලනායතනයක් යටතේ ස්ථිර වශයෙන් හෝ තාවකාලික වශයෙන් රක්‍ෂා වෙහි යෙදී සිටියේ නම් සහ ඒ සේවය යම් කලක නතර කරන ලද්දේ නම් එසේ සේවය නතර කිරීමට ඇති හේතු හා එසේ කළ දින පැහැදිලි වශයෙන් දක්වන්න :———.

(ඇ) පළාත් පාලන ආයතනවල සේවා කාලය පිළිබඳ සටහන් (තනතුරු), පළාත් පාලනායතන හා කාලසීමාවන් :———.

(ඈ) දැනට කරන රක්‍ෂාව—පහත සඳහන් විස්තර දෙන්න :—

(i) තනතුරේ පදවි නාමය, ශ්‍රේණිය හා ඊට පත් වූ දිනය :———.

(ii) දීමනා හැර දැනට ලබන වැටුප් හා වැටුප් ක්‍රමය :———.

(iii) විශ්‍රාම වැටුප් සහිතද :———.

(ඉ) සේවා මුක්ත හටයෙක් නම් :—
සේනාංකය, තරාතිරම, සේවයට බැඳුන දින හා නිදහස් කරන ලද දින පිළිබඳ විස්තර :———.

12. කියවීම, ලිවීම, කතා කිරීම, භාෂණ පරිවර්තනය පිළිබඳව ප්‍රවීණතාවක් ඇද්ද :———.

(අ) සිංහල :———.

(ආ) දෙමළ :———.

13. විශේෂ සුදුසුකම්—ගැසට් නිවේදනයෙහි සඳහන් කොට ඇති විශේෂ සුදුසුකම් සහ/හෝ පළපුරුද්ද ඔබට තිබේද? එසේ නම්, ඒ පිළිබඳ සම්පූර්ණ විස්තර, දින වකවානු සහිතව සඳහන් කරන්න :———.

14. කිසියම් අපරාධ වරදක් සඳහා අධිකරණය මඟින් වරදකරු කරනු ලැබුවේ ද? එසේ නම් දිනය, නඩු නොම්මරය හා වරදෙහි ස්වභාවය සඳහන් කරන්න :———.

15. මුදල් කරදරවලින් නිදහස් ද? එසේ නැත්නම් ඔබේ ණය බැඳීම්වල ප්‍රමාණය කෙතෙක් ද? :———.

16. වෙනත් විස්තර (විශේෂ ශිෂ්‍යත්ව ආදිය) :———.

17. චරිත සහතික ලබාගත් අයගේ නම සහ පදවි නාම :———.
(ඉදිරිපත් කළ යුත්තේ ඒ සහතිකවල මුල් ලිපි නොව පිටපත් පමණි. පළාත් පාලන සේවයේ උසස්ලබනගත තනතුරු දරණ සාමාජිකයින් විසින් මේ නියමයේ ප්‍රකාර ක්‍රියා කළ යුතු නොවේ.)

මේ අයදුම්පත්‍රයෙහි මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය බවත්, නිවැරදි බවත් මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසියම් කරුණක් අසත්‍ය හෝ වැරදි බැව් තෝරා ගනු ලැබීමට පළමු සොයා ගනු ලැබුවහොත් මා නුසුදුස්සෙකු බවට පත් වන බවත්, පත් කිරීමෙන් පසු වරද අනාවරණය වුවහොත් වන්දියක් නොමැතිව මා සේවයෙන් පහ කළ හැකි බවත් මම දනිමි.

———,
අයදුම්කරුගේ අත්සන.

දිනය :———.

සභාපති,
පළාත් පාලන සේවා කොමිෂන් සභාව,
තැ. පෙ. 530,
කොළඹ 1.

## පළාත් පාලන සේවය

කාර්යාල කාර්ය සහායක තනතුර—මැදපත්තු උතුර ගම් සභාව

පහත සඳහන් තනතුර සඳහා අයදුම් පත්‍ර කැඳවනු ලැබේ.

2. වැටුප් ක්‍රමය : වර්ෂයකට රුපියල් 540—30×24—රුපියල් 804 ; රු. 636 සහ රු. 732 යන වාර්ෂික වැටුප් වලට පළමු කාර්යක්‍ෂමතා කඩඉම් ඇත.

3. අවශ්‍ය සුදුසුකම් :—

(අ) වයස : 1965 දෙසැම්බර් මස 7 වැනි දිනට වයස අවුරුදු 20 ට නොඅඩු 30 ට නොවැඩි විය යුතුයි.

(ආ) අපේක්ෂකයෝ සිංහල/දෙමළ 6 වැනි ප්‍රමාණයෙන් සමත් වී සිටිය යුත්තාහ.

4. පළාත් පාලන සේවා සාමාජිකයන්ගේ හා ප්‍රාදේශීය බල මණ්ඩලවල ස්ථිර සේවයේ සිටින සේවකයන්ගේ අයදුම් පත්‍ර, ඔවුන් අනික් සුදුසුකම් ලබා ඇත්නම්, වයස පිළිබඳ නියමය නො තකා සලකා බලනු ලැබේ.

5. මේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසේ ආරම්භයේ පළකර තිබෙන පළාත් පාලන සේවයේ තනතුරුවලට පත්කිරීම් සම්බන්ධයෙන් අදාළ වන සාමාන්‍ය කොන්දේසි බලනු මැනවි.

6. ඉල්ලුම් පත්‍ර, පත්කිරීම් සම්බන්ධයෙන් යෙදෙන පොදු කොන්දේසි යටතේ ඇති ආදර්ශ ආකෘති පත්‍රයට අනුව සැරැනුකූලව පිළියෙළ කොට, 1965 දෙසැම්බර් මස 7 වැනි දිනට හෝ ඊට පළමු මැදපත්තු උතුර ගම් සභාවේ සභාපති වෙත ලැබෙන්නට එවිය යුතුයි.

එස්. ඒ. ඒ. මජීඩ්,
මැදපත්තු උතුර ගම් සභාවේ සභාපති.

1965 නොවැම්බර් මස 14 වැනි දින,
මැදපත්තු උතුර ගම්සභා කාර්යාලය,
තඹාල, පොලොන්නරුව.

11-787—65.11.19 දින අංක 14,561 දරන ගැසට් පත්‍රය

## පළාත් පාලන සේවය

**කාර්යාල කාර්ය සහාය සේවක—අග්බෝපුර ගම්සභාව කන්තලේ**

ඉහත සඳහන් තනතුර සඳහා අයදුම් පත්‍ර කැඳවනු ලැබේ.

2. වැටුප් ක්‍රමය.—වර්ෂයකට රුපියල් 540—30×8—24×1 රුපියල් 804. රුපියල් 636 සහ රුපියල් 732 යන වාර්ෂික වැටුප්වලට පෙර කාර්යක්ෂමතා කඩයිම් ඇත.

3. අවශ්‍ය සුදුසුකම්.—

(අ) වයස: 1965 දෙසැම්බර් මස 10 වැනි දිනට වයස අවුරුදු 20 නො අඩු 30 ට නොවැඩි විය යුතුයි.

(ආ) අපේක්ෂකයෝ සිංහල 6 වැනි ප්‍රමාණයෙන් සමත් වී සිටිය යුත්තාහ.

4. පළාත් පාලන සේවා සාමාජිකයින්ගේ හා ප්‍රාදේශීය බල මණ්ඩලවල ස්ථිර සේවයේ සිටින සේවකයින්ගේ අයදුම් පත්‍ර ඔවුන් අනෙකුත් සුදුසුකම් ලබා ඇත්නම් වයස පිළිබඳ නියමය නොතකා සලකා බලනු ලැබේ.

5. ගැසට් පත්‍රයේ IV වැනි කොටසේ ආරම්භයේ පළකර තිබෙන පළාත් පාලන සේවයේ තනතුරුවලට පත් කිරීම් සම්බන්ධයෙන් අදාලවන සාමාන්‍ය කොන්දේසි බලනු මැනවි.

6. ඉල්ලුම් පත්‍ර පත් කිරීම් සම්බන්ධයෙන් යෙදෙන පොදු කොන්දේසි යටතේ ඇති ආදර්ශ ආකෘති පත්‍රයට අනුව සාරානුකූලව පිළියෙල කොට 1965 දෙසැම්බර් මස 10 වැනි දිනට හෝ ඊට පළමු අග්බෝපුර ගම් සභාවේ සභාපති වෙත ලැබෙන්නට එවිය යුතුයි.

7. ඉංග්‍රීසි හෝ දෙමළ භාෂාව පිළිබඳ දැනුම විශේෂ සුදුසුකමක් ලෙසට සලකනු ලැබේ.

පී. එල්. සිරිසේන,
අග්බෝපුර ගම් සභාවේ සභාපති.

1965 නොවැම්බර් මස 9 දින,
අග්බෝපුර ගම්සභා කාර්යාලයේ දී ය.

11-621—65.11.19 දින අංක 14,561 දරන ගැසට් පත්‍රය

---

# අතුරු ව්‍යවස්ථා

## වැල්වෙට්ටිතුරෙයි සුළු නගර සභාව

### සුළු නගර සභා ආඥාපනත

(256 වැනි අධිකාරය වන) සුළු නගර සභා ආඥාපනතේ 152 හා 156 යන වගන්ති යටතේ වැල්වෙට්ටිතුරෙයි සුළු නගර සභාව විසින් සම්පාදිතව එකී ආඥාපනතේ 153 වැනි වගන්තියෙන් පළාත් පාලන ඇමැතිවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ඔහු විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථාව.

ඒ. ටී. ගොගර්ලි මොරගොඩ,
පළාත් පාලන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1965.10.27 වැනි දින,
කොළඹ දී ය.

### අතුරු ව්‍යවස්ථාව

1. 1962 ජූනි 8 වැනි දින අංක 13,162 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද අතුරු ව්‍යවස්ථා වලින් අන්තිමවරට සංශෝධනය කරන ලද 1949 ජූලි 22 වැනි දින අංක 10,000 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද අතුරු ව්‍යවස්ථා පහත සඳහන් පරිදි මෙයින් තව දුරටත් සංශෝධනය කරනු ලැබේ:—එහි 1 වැනි අතුරු ව්‍යවස්ථාවෙහි "අප්‍රසන්න හෝ අන්තරාදායක ව්‍යාපාර" යන්නෙහි අර්ථ නිරූපණයෙහි "උළු ගබඩා කිරීම" යන වචන වෙනුවට "උළු ගබඩා කිරීම් පට්ටලයක් පවත්වාගෙන යාම බෝට්ටු සෑදීම සඳහා අංගනයක් පවත්වාගෙන යාම. මෝටර්රථ හෝ සාමාන්‍ය බයිසිකල් අළුත්වැඩියා කිරීමේ හෝ සර්විස් කිරීමේ ආයතනයක් පවත්වාගෙන යාම. විදුලිය වැඩ පොළක් පවත්වාගෙන යාම. වැල්ඩිං කිරීම සඳහා හෝ ලියවන පට්ටලයක් පාවිච්චි කරනු ලබන වැඩ සඳහා වැඩ පොළක් පවත්වාගෙන යාම. ලෝහමය භාණ්ඩ සුන් බුන් ගබඩා කර තබා ගැනීම. තෙල් ගබඩා කර තබා ගැනීම. දර හෝ දව ගබඩා කර තබා ගැනීම. මාළු ලුණු ද සකස් කිරීම, වියලීම හෝ අයිස් දැමීම." යන වචනය ආදේස කිරීමෙන්.

2. 1 වෙනි අතුරු ව්‍යවස්ථාවේ අගට පහත සඳහන් වචන එකතු කිරීමෙන් :—

"පහත සඳහන් ව්‍යාපාර අන්තරාදායක හා අප්‍රසන්න ව්‍යාපාර වශයෙන් සැලකිය යුතු යි:—

බැටරි පිරවීම."

11-862—65.11.19 දින අංක 14,561 දරන ගැසට් පත්‍රය

---

# ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන

## ගලේවෙල සුළු නගර සභාව

**1963 දෙසැම්බර් මස 31 වැනි දිනට වත්කම් සහ බැරකම් ප්‍රකාශනය**

**බැරකම්**

| | රු. ශ. | රු. ශ. | රු. ශ. |
|---|---|---|---|
| කැන්පත් ... ... | | | 5 52 |
| විවිධ ණය හිමියෝ ... | | | 67 96 |
| 1.7.1963 වැනි දිනට අධිකය ... | | 15,751 47 | |
| 1963 ආදායම ... ... | 18,201 1 | | |
| 1963 වියදම ... ... | 16,046 14 | | |
| | | 2,154 87 | |
| | | | 17,906 34 |
| | | | 17,979 82 |

**වත්කම්**

| | රු. ශ. | රු. ශ. |
|---|---|---|
| අත්තිකාරම් ... ... | | 75 0 |
| ආදායම් රැස්කිරීමේ ගිණුම්— | | |
| දේපල බදු ... ... | 2,249 38 | |
| කැලි කසළ ගාස්තු ... ... | 612 0 | |
| වැසිකිළි ගාස්තු ... ... | 498 0 | |
| වරෙන්තු ගාස්තු ... ... | 24 27 | |
| | | 3,383 65 |
| විවිධ ණය ගැතියෝ ... ... | | 13,239 10 |
| මුදල් ... ... ... | | 1,282 7 |
| | | 17,979 82 |

ගලේවෙල සුළු නගර සභාවේ සභාපති තැන්පත් ගාර්දිය හෙට්ටිආරච්චිගේ හෙන්ද්‍රික් අප්පුහාමි වන මම, ඉහත සඳහන් ප්‍රකාශනය මාගේ සම්පූර්ණ දැනීමේ හා විශ්වාසයේ හැටියට 1963 දෙසැම්බර් මස 31 වැනිද වන විට, ගලේවෙල සුළු නගර සභාවේ වත්කම් හා බැරකම් පිළිබඳ නිවැරදිවූත්, සත්‍යවූත් වාර්තාවක් බවට මෙයින් සහතික කරමි.

නිවැරදි බවට සහතික කරණ ලදී.

ඩී. ඇස්. අබේවර්ධන,
අංක 8 දරණ කොට්ඨාශයේ සාමාජික.

ගා. හෙ. ආ. හෙන්ද්‍රික් අප්පුහාමි,
සභාපති,
ගලේවෙල සුළු නගර සභාව.

වර්ෂ 1965 ජූනි මස 22 වැනි දින මා ඉදිරිපිටදී, ගලේවෙලදී සහතික කරණ ලදී.

ටී. තෙවනේෂන්
සමාදාන විනිශ්චයකාරතුමා.

වර්ෂ 1965 ජූනි මස 22 වැනි දින,
ගලේවෙල සුළු නගර සභා කාර්යාලයේදීය.

## ගලේවෙල සුළු නගර සභාව

### ආදායම් සහ වියදම් පිළිබඳ ප්‍රකාශණය

1963.7.1 සිට 1963.12.31 දින දක්වාවූ කාලයේ ආදායම සහ වියදම පිළිබඳ ප්‍රකාශණය

**ආදායම්**

| | රු. ශ. | රු. ශ. |
|---|---|---|
| ඒ.—සාමාන්‍ය ආදායම ... | ... 13,056 91 | |
| ඩී.—මහජන සනිපාරක්ෂාව ... | ... 2,101 0 | |
| ඊ.—මහජන විනෝදය ... | ... 3,043 10 | |
| | | 18,201 1 |
| වෙනත් ලැබීම්— | | |
| (1) තැන්පත් මුදල් ... | ... 3,868 14 | |
| (2) අත්තිකාරම් මුදල් ... | ... 6,114 28 | |
| (3) අධිකතා සහ ඌනතා මුදල් ගිණුම | ... 15,751 47 | |
| (4) විවිධ ණය ගැතියෝ ... | ... 116 95 | |
| (5) විවිධ ණය හිමියෝ ... | ... 67 96 | |
| (6) ආදායම් රැස්කිරීමේ ගිණුම්— | | |
| (අ) දේපල බදු ... | ... 3,999 31 | |
| (ආ) වැසිකිළි ගාස්තු ... | ... 990 0 | |
| (ඇ) කැළි කසළ ගාස්තු ... | ... 1,139 0 | |
| (ඈ) වරෙන්තු ගාස්තු ... | ... 1 79 | |
| | | 32,048 90 |
| | | 50,249 91 |

**වියදම්**

| | රු. ශ. | රු. ශ. |
|---|---|---|
| ඒ.—සාමාන්‍ය වියදම් ... | ... 12,081 92 | |
| බී.—මංමාවත් ... | ... 592 20 | |
| සී.—නගර සභා ඉඩම් සහ ගොඩනැගිලි | ... 158 7 | |
| ඩී.—මහජන සනිපාරක්ෂාව ... | ... 3,037 95 | |
| ඊ.—මහජන විනෝදය ... | ... 176 0 | |
| | | 16,046 14 |
| වෙනත් ගෙවීම්— | | |
| (1) තැන්පත් මුදල් ආපසු ගෙවීම | ... 3,862 62 | |
| (2) අත්තිකාරම් මුදල් ... | ... 6,189 28 | |
| (3) අධිකතා සහ ඌනතා ගිණුම | ... — | |
| (4) විවිධ ණය ගැතියෝ ... | ... 13,356 5 | |
| (5) විවිධ ණය හිමියෝ ... | ... — | |
| (6) ආදායම් රැස්කිරීමේ ගිණුම්— | | |
| (අ) දේපල බදු ... | ... 6,248 69 | |
| (ආ) වැසිකිළි ගාස්තු ... | ... 1,488 0 | |
| (ඇ) කැළි කසළ ගාස්තු... | ... 1,751 0 | |
| (ඈ) වරෙන්තු ගාස්තු ... | ... 26 6 | |
| | | 32,921 70 |
| 1963 දෙසැම්බර් මස 31 වැනි දිනට ඉතිරි මුදල්... | | 1,282 7 |
| | | 50,249 91 |

ගලේවෙල සුළු නගර සභාවේ සභාපති තැන්පත්, ගාර්දිය හෙට්ටිආරච්චිගේ හෙන්ද්‍රික් අප්පුහාමි වන මම, ඉහත සඳහන් ප්‍රකාශණය, මාගේ සම්පූර්ණ දැනීමේ හා විශ්වාසයේ හැටියට 1963.7.1 සිට 1963.12.31 දින දක්වාවූ කාලයේ ගලේවෙල සුළු නගර සභාවේ ආදායම් සහ වියදම් පිළිබඳව නිවැරදිවූත්, සත්‍යවූත් ප්‍රකාශණයක් බවට මෙයින් සහතික කරමි.

නිවැරදි බවට සහතික කරමි.

ඩී. ඇස්. අබේවර්ධන,
අංක 5 දරණ කොට්ඨාශයේ සභික,

ගා. හෙ. ආ. හෙන්ද්‍රික් අප්පුහාමි,
ගලේවෙල සුළු නගර සභාවේ සභාපති.

වර්ෂ 1965 ජූනි මස 22 වැනි දින මා ඉදිරියේදී සහතික කරණලදී.

ටී. තෙවනේෂන්,
සමාදාන විනිශ්චයකාර තැන.

වර්ෂ 1965 ජූනි මස 22 වැනි දින,
ගලේවෙල සුළු නගර සභා කාර්යාලයේදීය.

### 1963 දෙසැම්බර් මස 31 වැනි දිනට වත්කම් සහ බැරකම් ප්‍රකාශණය

**බැරකම්**

| | රු. ශ. | රු. ශ. | රු. ශ. |
|---|---|---|---|
| තැන්පත්—මිශ්‍රිත ... | | | 1,386 63 |
| තැන්පත්—රජයේ ආධාර— | | | |
| මංමාවත් ... ... | | 681 0 | |
| ප්‍රජාමණ්ඩල ... ... | | 198 50 | |
| කැළි කසළ සේවය ... | | 22 20 | |
| | | | 901 70 |
| විවිධ ණය හිමියෝ ... | | | 2,159 54 |
| 1.1.64 වැනි දිනට අධිකය ... | | 17,906 34 | |
| සකස් කිරීම ... ... | | 206 0 | |
| | | 17,700 34 | |
| 1964 වියදම ... | ... 48,627 88 | | |
| 1964 ආදායම ... | ... 46,134 31 | | |
| | | 2,493 57 | |
| | | | 15,206 77 |
| | | | 19,654 64 |

**වත්කම්**

| | රු. ශ. | රු. ශ. |
|---|---|---|
| අත්තිකාරම් ... ... | | 158 0 |
| විවිධ ණය ගැතියෝ ... ... | | 5,527 72 |
| ආදායම් රැස්කිරීමේ ගිණුම්— | | |
| දේපල බදු ... | ... 3,843 27 | |
| විශේෂ කසළ බදු ... | ... 770 64 | |
| වැසිකිළි ගාස්තු ... | ... 342 0 | |
| කැළි කසළ ගාස්තු ... | ... 116 0 | |
| කුලී ... ... | ... 40 0 | |
| වරෙන්තු ගාස්තු ... | ... 41 88 | |
| | | 5,153 79 |
| මුදල් ... ... ... | | 8,815 13 |
| | | 19,654 64 |

ගලේවෙල සුළු නගර සභාවේ සභාපති තැන්පත්, ගාර්දිය හෙට්ටිආරච්චිගේ හෙන්ද්‍රික් අප්පුහාමි වන මම, ඉහත සඳහන් ප්‍රකාශණය මාගේ සම්පූර්ණ දැනීමේ හා විශ්වාසයේ හැටියට, 1964 දෙසැම්බර් මස 31 වැනිද වන විට, ගලේවෙල සුළු නගර සභාවේ වත්කම් හා බැරකම් පිළිබඳ, නිවැරදිවූත්, සත්‍යවූත්, වාර්තාවක් බවට මෙයින් සහතික කරමි.

නිවැරදි බවට සහතික කරණ ලදී.

ඩී. ඇස්. අබේවර්ධන,
අංක 5 දරණ කොට්ඨාශයේ සාමාජික.

ගා. හෙ. ආ. හෙන්ද්‍රික් අප්පුහාමි,
සභාපති,
ගලේවෙල සුළු නගර සභාව.

වර්ෂ 1965 ජූනි මස 22 වැනි දින මා ඉදිරිපිටදී, ගලේවෙලදී සහතික කරණ ලදී.

ටී. තෙවනේෂන්,
සමාදාන විනිශ්චයකාරතැන.

වර්ෂ 1965 ජූනි මස 22 වැනි දින,
ගලේවෙල සුළු නගර සභා කාර්යාලයේ දීය.

### 1964 වර්ෂයේ ආදායම් සහ වියදම් පිළිබඳ ප්‍රකාශණය

**ආදායම්**

| | රු. ශ. | රු. ශ. |
|---|---|---|
| ඒ.—සාමාන්‍ය ආදායම් ... | ... 29,170 60 | |
| බී.—මංමාවත් ... | ... — | |
| සී.—නගර සභා ඉඩම් සහ ගොඩනැගිලි | ... 560 0 | |
| ඩී.—මහජන සෞඛ්‍යය ... | ... 4,581 10 | |
| ඊ.—මහජන විනෝදය ... | ... 12,006 5 | |
| ජී.—සුනඛයින් ලියාපදිංචි කිරීම | ... 16 50 | |
| | | 46,134 81 |
| වෙනත් ලැබීම්— | | |
| (1) තැන්පත්—රජයේ ආධාර | ... 2,850 50 | |
| (2) තැන්පත්—මිශ්‍රිත ... | ... 8,485 56 | |
| (3) අත්තිකාරම් ... | ... 1,431 11 | |
| (4) විවිධ ණය ගැතියෝ ... | ... 12,434 5 | |
| (5) විවිධ ණය හිමියෝ ... | ... 2,159 54 | |
| (6) අධිකතා සහ ඌනතා ගිණුම | ... 16 0 | |
| | | 22,376 76 |
| (7) ආදායම රැස්කිරීමේ ගිණුම— | | |
| (අ) දේපල බදු ... | ... 6,895 17 | |
| (ආ) විශේෂ කසළ බදු ... | ... 1,482 46 | |
| (ඇ) වැසිකිළි ගාස්තු ... | ... 2,234 0 | |
| (ඈ) කැළි කසළ ගාස්තු ... | ... 512 0 | |
| (ඉ) වරෙන්තු ගාස්තු ... | ... 67 89 | |
| (ඊ) කුලී ... | ... 320 0 | |
| | | 11,511 52 |
| 1963 දෙසැම්බර් මස 31 වැනි දිනට ඉතිරි මුදල් ... | | 1,282 7 |
| | | 81,304 66 |

**වියදම්**

| | රු. ශ. | රු. ශ. |
|---|---|---|
| ඒ.—සාමාන්‍ය වියදම් ... | ... 25,109 25 | |
| බී.—මංමාවත් ... | ... 7,371 40 | |
| සී.—නගර සභා ඉඩම් සහ ගොඩනැගිලි | ... 1,634 30 | |
| ඩී.—මහජන සෞඛ්‍යය ... | ... 14,199 18 | |
| ඊ.—මහජන විනෝදය ... | ... 308 50 | |
| ජී.—සුනඛයින් ලියාපදිංචිකිරීම | ... 5 25 | |
| | | 48,627 88 |
| වෙනත් ගෙවීම්— | | |
| (1) තැන්පත්—රජයේ ආධාර | ... 1,948 80 | |
| (2) තැන්පත්—මිශ්‍රිත ... | ... 2,104 45 | |
| (3) අත්තිකාරම් ... | ... 1,514 11 | |
| (4) විවිධ ණය ගැතියෝ ... | ... 4,722 67 | |
| (5) විවිධ ණය හිමියෝ ... | ... 67 96 | |
| (6) අධිකතා සහ ඌනතා ගිණුම | ... 222 0 | |
| | | 10,579 99 |
| (7) ආදායම් රැස්කිරීමේ ගිණුම— | | |
| (අ) දේපල බදු ... | ... 8,489 6 | |
| (ආ) විශේෂ කසළ බදු | ... 2,253 10 | |
| (ඇ) වැසිකිළි ගාස්තු ... | ... 2,078 0 | |
| (ඈ) කැළි කසළ ගාස්තු | ... 16 0 | |
| (ඉ) වරෙන්තු ගාස්තු ... | ... 85 50 | |
| (ඊ) කුලී ... | ... 360 0 | |
| | | 13,281 66 |
| 1964 දෙසැම්බර් මස 31 වැනි දිනට ඉතිරි මුදල් ... | | 8,815 13 |
| | | 81,304 66 |

ගලේවෙල සුළු නගර සභාවේ සභාපති තැන්පත්, ගාර්දිය හෙට්ටිආරච්චිගේ හෙන්ද්‍රික් අප්පුහාමි වන මම, ඉහත සඳහන් ප්‍රකාශණය, මාගේ සම්පූර්ණ දැනීමේ හා විශ්වාසයේ හැටියට 1964 වර්ෂයේ, ගලේවෙල සුළු නගර සභාවේ ආදායම් සහ වියදම් පිළිබඳව නිවැරදිවූත්, සත්‍යවූත්, ප්‍රකාශණයක් බවට මෙයින් සහතික කරමි.

නිවැරදි බවට සහතික කරමි.

ඩී. ඇස්. අබේවර්ධන,
අංක 5 දරණ කොට්ඨාශයේ සභික.

ගා. හෙ. ආ. හෙන්ද්‍රික් අප්පුහාමි,
ගලේවෙල සුළු නගර සභාවේ සභාපති.

වර්ෂ 1965 ජූනි මස 22 වැනි දින මා ඉදිරියේදී සහතික කරණ ලදී.

ඊ. තෙවනේෂන්,
සමාදාන විනිශ්චයකාර තැන.

වර්ෂ 1965 ජූනි මස 22 වැනි දින,
ගලේවෙල සුළු නගර සභා කාර්යාලයේදිය.

11–857—65.11.19 දින අංක 14,561 දරන ගැසට් පත්‍රය

---

## අය-වැය ලේඛන

### අවිස්සාවේල්ල පළාත් ආණ්ඩු සභාව

**මුදල් රෙගුලාසි අංක 12 (ii) යටතේ කෙරෙන අයදුම් පත්‍රයි**

1965 අය–වැය ලේඛනය

1965 අයවැය ලේඛනයේ ඒ ඒ ශීර්ෂයන් යටතේ වෙන්කරන ලද මුදල් වලින් ඉතිරිවේයයි ගණන් බලන ලද පහත දක්වෙන වැය ශීර්ෂ යටතේ සඳහන් මුදල් ඊට අනුරූපව දක්වෙන වැය ශීර්ෂවලට මාරුකර, අවශ්‍යව තිබෙන අතිරේක වැය සඳහා එම ශීර්ෂ යටතේ යෙදීමට 1965 ක්වූ ඔක්තෝබර් මස 30 වෙනි දින පවත්වන ලද අවිස්සාවේල්ල පළාත් ආණ්ඩු සභාවේ මාසික රැස්වීමේ අංක 10 දරණ සභා තීරණයෙන් සම්මතවී තිබේ:—

**1965 අයවැය ලේඛනයේ වෙන්කර තිබෙන මුදල් වලින් ඉතිරිවේයයි ගණන් බලන ලද ශීර්ෂයන් හා මුදල්**

| | රු. | ශ. |
|---|---|---|
| ඒ.—සාමාන්‍ය වියදම් :— | | |
| (2) කාර්‍ය මණ්ඩලීය වියදම්— | | |
| (සී) අයබදු අයකරන්නන්ට කොමිස් … … | 400 | 0 |
| බී.—මංමාවත් :— | | |
| (6) සළකුණු සහ සංඥාපුවරු පිළිබඳ වියදම් … | 500 | 0 |
| ඊ.—මහජන සෞඛ්‍යය :— | | |
| (1) සාමාන්‍ය— | | |
| (ජී) වතුර බැස්සීමේ කාණු … … | 500 | 0 |
| (3) වැසිකිළි ශුද්ධ කිරීම— | | |
| (සී) ගබඩා බඩු … … … | 500 | 0 |
| (4) ගවඝාතක මඩුව සහ ගාල— | | |
| (බී) නඩත්තුව … … … | 500 | 0 |
| (5) ජලසම්පාදනය— | | |
| (බී) ගබඩා බඩු … … … | 500 | 0 |
| (6) ආරෝග්‍යශාලා (නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාව)— | | |
| (සී) දූව භාණ්ඩ … … … | 150 | 0 |
| ඇෆ්.—මහජන ක්‍රීඩා :— | | |
| (6) විනෝද බදු පරීක්ෂකයින්ගේ දීමනා … | 100 | 0 |
| ජී.—සොහොන් බිම් :— | | |
| (2) නඩත්තුව … … … | 1,500 | 0 |
| ජේ.—විදුලි දෙපාර්තමේන්තුව :— | | |
| (2) අළුත් වැඩියා කිරීම සහ නඩත්තුව— | | |
| (සී) මීටර් ස්විච් යතුරු සහ වෙනත් උපකරණ … | 4,000 | 0 |
| (4) පාලනය සහ සාමාන්‍ය වියදම්— | | |
| (ඩී) විවිධ සුළු සේවාවන් … … | 1,500 | 0 |
| **එකතුව** … | 10,150 | 0 |

**අතිරේක වැය අවශ්‍ය වී තිබෙන ශීර්ෂයන් හා මුදල්**

| | රු. | ශ. |
|---|---|---|
| ඒ.—සාමාන්‍ය වියදම් :— | | |
| (2) කාර්‍ය මණ්ඩලීය වියදම්— | | |
| (බී) ගමන් ගාස්තු … … … | 150 | 0 |
| බී.—මංමාවත් :— | | |
| (8) සංවර්ධනය … … … | 6,650 | 0 |
| ඩී.—නගර සභා ඉඩම් සහ ගොඩනැගිලි :— | | |
| (4) නඩත්තුව … … … | 3,350 | 0 |
| **එකතුව** … | 10,150 | 0 |

ලීලාරත්න විජේසිංහ,
සභාපති,
අවිස්සාවේල්ල පළාත් ආණ්ඩු සභාව.

පළාත් ආණ්ඩු සභා කාර්‍යාලය,
අවිස්සාවේල්ල,
1965 නොවැම්බර් මස 5 වැනි දින.

11—811—65.11.19 දින අංක 14,561 දරන ගැසට් පත්‍රය

---

## අළුත්ගම සුළු නගර සභාව

**සුළු නගර සභා මුදල් රෙගුලාසි අංක 40 (II) දරණ කොටස යටතේ අයදුම් පත**

### වර්ෂ 1965 අය වැය ලේඛනය

1965 අයවැය ලේඛනයේ ඒ ඒ ශීර්ෂය යටතේ වෙන් කරන ලද මුදල් වලින් ඉතිරිවේයයි ගණන් බලන ලද පහත දක්වෙන ශීර්ෂ යටතේ මුදල් ඊට අනුරූපව දක්වෙන වැය ශීර්ෂවලට මාරුකර අවශ්‍ය වී තිබෙන අතිරේක වැය සඳහා එම ශීර්ෂ යටතේ යෙදීමට 1965.6.12 යෝජනා අංක 11, 1965.10.16 යෝජනා අංක 19 හා 65.10.30 යෝජනා අංක 9 න් සභා සම්මත විය.

I වෙනි කොටස—සාමාන්‍ය

**65.6.12 යෝජනා අංක 11**

| ඉතිරි මුදල් වැය ශීර්ෂය | මුදල රු. | ශ. | වැඩිපුර වියදම් වැය ශීර්ෂය | මුදල රු. | ශ. |
|---|---|---|---|---|---|
| බී. 12 අළුත් වැඩ … … … | 2,000 | 0 | ඩී. 6 (ජී) ඉදිකිරීම … … … | 7,000 | 0 |
| සී. 4 නඩත්තු කිරීම … … | 3,000 | 0 | | | |
| ඩී. 4 (බී) නඩත්තු කිරීම … … | 2,000 | 0 | | | |
| | 7,000 | 0 | | 7,000 | 0 |

**65.10.16 යෝජනා අංක 19**

| | | | | | |
|---|---|---|---|---|---|
| ඩී. 1 (එච්) කානු ඉදිකිරීම … … … | 5,000 | 0 | ජේ. 4 දූව ද්‍රව්‍ය … … … | 5,000 | 0 |
| | 5,000 | 0 | | 5,000 | 0 |

II වැනි කොටස—විදුලි අංශය

**65.10.30 යෝජනා අංක 9**

| | රු. | ශ. | | රු. | ශ. |
|---|---|---|---|---|---|
| ඩී. 6 දීර්ඝ කිරීම හා දියුණු කිරීම … … | 6,025 | 0 | 1 විදුලි බලය උත්පාදනය— | | |
| | | | (ඩී) විදුලි බලය මිලයට ගැනීම … | 3,000 | 0 |
| | | | 2 (සී) මාපක යන්ත්‍ර ඇන හා අනික් උපකරණ … | 500 | 0 |
| | | | 2 (ඩී) විදුලි බලය සැපයීමේ ප්‍රධාන කම්බි නඩත්තු කිරීම … | 1,625 | 0 |
| | | | 4 (ඒ) පරිපාලක වේතන හා ආධාර … … | 250 | 0 |
| | | | 4 (සී) මුද්‍රණය හා ලිපි ද්‍රව්‍ය … … | 100 | 0 |
| | | | 4 (ඩී) නානා ප්‍රකාර වියදම් … … | 500 | 0 |
| | | | 5 (ඒ) පොලිය … … … | 50 | 0 |
| **එකතුව** … | 6,025 | 0 | එකතුව … | 6,025 | 0 |

ජී. ඇල්. වී. ද සිල්වා,
සභාපති,
අළුත්ගම සුළු නගර සභාව.

1965 නොවැම්බර් මස 11 වැනි දින,
අළුත්ගම සුළු නගර සභා කාර්‍යාලය.

11—836/1—65.11.19 දින අංක 14,561 දරන ගැසට් පත්‍රය

## අළුත්ගම සුළු නගර සභාව

### 1965 වර්ෂයේ පළමුවන පරිපූරක අයවැය ලේඛනය

### සාමාන්‍ය අංශය

| වැය ශීර්ෂය හා උප ශීර්ෂය | මුදල රු. | ශ. | සභාවේ අනුමැතිය |
|---|---|---|---|
| ඒ.—සාමාන්‍ය වියදම :— | | | |
| 1. සේවකයන්ගේ වැටුප්— | | | |
| (ඒ) ලේකම් | 100 | 0 | 65.10.16 දින අංක 22 යෝජනාව |
| (බී) ලිපිකරුවන් | 150 | 0 | එම |
| (ඩී) පියන්වරු | 75 | 0 | එම |
| (ජී) ජීවන සහ විශෙෂ ජීවන ආධාර | 650 | 0 | 65.6.12 දින අංක 10 යෝජනාව |
| 2. කාර්‍ය මණ්ඩලයේ වියදම්— | | | |
| (ඒ) ආධාර (එලවුන්ස්) | 200 | 0 | 65.10.16 දින අංක 22 යෝජනාව |
| | 70 | 0 | 65.7.10 දින අංක 18 යෝජනාව |
| (බී) ගමන් ගාස්තු | 500 | 0 | 65.6.12 දින අංක 12 යෝජනාව |
| | 400 | 0 | 65.10.16 දින අංක 22 යෝජනාව |
| | 250 | 0 | 65.1.14 දින අංක 20 යෝජනාව |
| (ඊ) නීතියේ කටයුතු සඳහා | 1,500 | 0 | 65.5.8 දින අංක 18 යෝජනාව |
| | 1,750 | 0 | 65.10.16 දින අංක 22 යෝජනාව |
| (ඇෆ්) ලිපි ද්‍රව්‍ය මුද්‍රණය ප්‍රසිද්ධ කිරීම් සහ මුද්දර | 500 | 0 | එම |
| (අයි) නිවාඩු දුම්රිය ප්‍රවේශ පත්‍ර | 500 | 0 | එම |
| (ඇම්) නිල ඇඳුම් | 130 | 0 | 65.4.10 දින අංක 6 යෝජනාව |
| 4. ආධාර හා දීමනා | 250 | 0 | 65.9.11 දින අංක 7 යෝජනාව |
| 5. පාසැල් පොත් | 1,000 | 0 | 65.2.13 දින අංක 5 යෝජනාව |
| බී.—මහා මාර්ග :— | | | |
| 1. වේතන හා දෛනික වැටුප්— | | | |
| (බී) ඕවර්සියර්වරුන්ට | 525 | 0 | 65.10.16 දින අංක 22 යෝජනාව |
| 2. නඩත්තු කිරීම | 5,000 | 0 | 65.4.10 දින අංක 5 යෝජනාව |
| | 5,000 | 0 | 65.6.12 දින අංක 12 යෝජනාව |
| 3. සංස්කරණය | 800 | 0 | 65.3.13 දින අංක 3 යෝජනාව |
| | 4,000 | 0 | 65.4.10 දින අංක 5 යෝජනාව |
| 13. ජීවන හා විශෙෂ ජීවන ආධාර | 350 | 0 | 65.10.16 දින අංක 22 යෝජනාව |
| සී.—නගර සභා ඉඩම් හා ගොඩනැගිලි :— | | | |
| 1. වේතන | 175 | 0 | එම |
| 8. ජීවන හා විශෙෂ ජීවන ආධාර | 125 | 0 | එම |
| ඩී.—සනීපාරක්ෂාව :— | | | |
| 1. සාමාන්‍ය— | | | |
| (කේ) කිරිවර්ග කිරීමේ වියදම් | 25 | 0 | 65.3.13 දින අංක 4 යෝජනාව |
| (ඇන්) මාතෘ නිවාසය හා දරකාභිවෘද්ධි නිවාසය | 1,500 | 0 | 65.4.10 දින අංක 17 යෝජනාව |
| 2. කසල ශෝධනය— | | | |
| (ඒ) වේතන | 500 | 0 | 65.10.16 දින අංක 22 යෝජනාව |
| (බී) කරත්ත, ගොනුන් හා ලොරි | 375 | 0 | එම |
| (සී) ගබඩා | 500 | 0 | 65.5.8 දින අංක 9 යෝජනාව |
| 3. වැසිකිළි පවිත්‍ර කිරීම— | | | |
| (ඒ) වේතන | 1,200 | 0 | 65.10.16 දින අංක 22 යෝජනාව |
| (බී) කරත්ත, ගොනුන් සහ ලොරි | 250 | 0 | 65.10.16 දින අංක 18 යෝජනාව |
| (සී) ගබඩා | 300 | 0 | 65.9.11 දින අංක 18 යෝජනාව |
| 4. සත්ව ඝාතන හා ගවමඩුව— | | | |
| (ඩී) ඉදිකිරීම | 8,500 | 0 | 65.6.12 දින අංක 12 යෝජනාව |
| 5. ජල සම්පාදනය— | | | |
| (එච්) ප්‍රසිද්ධ නාන ස්ථාන | 1,500 | 0 | 65.4.10 දින අංක 5 යෝජනාව |
| | 1,500 | 0 | 65.6.12 දින අංක 12 යෝජනාව |
| 7. වෙළඳ පොලවල් හා ගාල්— | | | |
| (බී) නඩත්තු කිරීම | 2,000 | 0 | 65.6.12 දින අංක 13 යෝජනාව |
| ඇෆ්.—සොහොන් බිම :— | | | |
| 1. වේතන | 75 | 0 | 65.10.16 දින අංක 22 යෝජනාව |
| ජේ.—කියවීම් ශාලාව සහ පුස්තකාලය :— | | | |
| 1. වේතන | 50 | 0 | එම |
| එකතුව | 42,275 | 0 | |

ජී. ඇල්. ටී. ද සිල්වා,
සභාපති,
අළුත්ගම සුළුනගර සභාව.

1965 නොවැම්බර් මස 11 වැනි දින,
අළුත්ගම සුළුනගර සභා කාර්‍යාලයේදීය.

11—836/2—65.11.19 දින අංක 14,561 දරන ගැසට් පත්‍රය

## අම්බලන්ගොඩ පළාත් ආණ්ඩු සභාව

**මුදල් රෙගුලාසි නීති අංක 12 (II) යටතේ කෙරෙන අයදුම් පත්‍රය**

1965 අය-වැය ලේඛනය

මෙහි පහත ඉතිරි වැය යටතේ දක්වෙන ශීර්ෂයන්ගේ මුදල් ඒ සමග වැඩිපුර වියදම් යටතේ දක්වෙන ශීර්ෂවලට මාරුකර ඉන් වැය කිරීමට 1965 ඔක්තෝබර් මස 16 වෙනි දින පවත්වන ලද පළාත් ආණ්ඩු සභා රැස්වීමේදී යෝජිත අංක 22 න් සභා සම්මත කරන ලදී:—

**ඉතිරි වැය**

| | | රු. | ශ. |
|---|---|---|---|
| ඒ. 2 (ඒ) | අමතර දීමනා ... ... | 1,250 | 0 |
| බී. 1 (සී) | කම්කරුවෝ ... ... ... | 850 | 0 |
| බී. 6 | සළකුණු හා සංඥා පුවරු ... ... | 300 | 0 |
| ඩී. 7 | අළුත් වැඩ ... ... ... | 1,000 | 0 |
| ඊ. 1 (ජී) | වතුර බැස්වීමේ කානු තැනීම ... ... | 2,500 | 0 |
| ඊ. 2 (ඊ) | ජීවනාධාර සහ විශේෂ දීමනා ... ... | 3,000 | 0 |
| ඊ. 3 (ඒ) | පඩිනඩි ... ... ... | 2,500 | 0 |
| ඊ. 3 (බී) | කරත්ත, ගොනුන් සහ ලොරි ... ... | 2,000 | 0 |
| ඊ. 3 (ඊ) | වැසිකිළි නඩත්තුව ... ... | 250 | 0 |
| ඊ. 3 (ජී) | වැසිකිළි තැනීම ... ... | 2,000 | 0 |
| ඊ. 3 (එච්) | ජීවනාධාර සහ විශේෂ දීමනා ... ... | 265 | 0 |
| ඊ. 5 (එච්) | ප්‍රසිද්ධ නාන ස්ථාන ... ... | 1,000 | 0 |
| ඊ. 6 (ඒ) | පඩිනඩි ... ... ... | 800 | 0 |
| ඊ. 6 (බී) | නඩත්තුව ... ... ... | 1,000 | 0 |
| ඊ. 7 (බී) | නඩත්තුව ... ... ... | 1,000 | 0 |
| එෆ්. 4 | ඉඩම් ලබා ගැනීම ... ... | 1,000 | 0 |
| ජේ. 2 (සී) | මීටර්, ස්විච් යතුරු සහ වෙනත් උපකරණ ... | 4,000 | 0 |
| ජේ. 3 (ඒ) | ද්‍රව්‍ය ... ... ... | 3,500 | 0 |
| ජේ. 4 (ඩී) | විවිධ සුළු සේවාවන් ... ... | 1,000 | 0 |
| ජේ. 6 | දියුණු කිරීම සහ සංවර්ධන වැඩ ... ... | 5,000 | 0 |
| | | 34,215 | 0 |

**අධික වැය**

| | | රු. | ශ. |
|---|---|---|---|
| ඒ. 1 (ඒ) | ලේකම් තැන ... ... | 165 | 0 |
| ඒ. 1 (සී) | පියන්වරු ... ... ... | 50 | 0 |
| ඒ. 1 (ඊ) | විශ්‍රාම වැටුප් ... ... ... | 200 | 0 |
| ඒ. 2 (බී) | ගමන් ගාස්තු ... ... ... | 200 | 0 |
| ඒ. 2 (ඊ) | අධිකරණ ගාස්තු ... ... | 400 | 0 |
| ඒ. 2 (එෆ්) | ලිපි ද්‍රව්‍ය, මුද්‍රණ, ප්‍රසිද්ධ කිරීම සහ කාර්යාලීය කටයුතු | 2,500 | 0 |
| ඒ. 2 (කේ) | ජීවනාධාර සහ විශේෂ ජීවනාධාර දීමනා ... | 2,100 | 0 |
| ඒ. 2 (එල්) | අතිකාල දීමනා ... ... | 200 | 0 |
| බී. 1 (බී) | ඕවර්සියර්වරු ... ... | 300 | 0 |
| බී. 2 | නඩත්තුව ... ... ... | 3,000 | 0 |
| බී. 8 | සංවර්ධනය ... ... ... | 10,000 | 0 |
| බී. 12 | අළුත් වැඩ ... ... ... | 2,000 | 0 |
| සී. 1 | වැටුප් ... ... ... | 350 | 0 |
| සී. 3 | ගෘහ භාණ්ඩ සහ උපකරණ ... ... | 500 | 0 |
| සී. 4 | සංවර්ධනය ... ... ... | 3,000 | 0 |
| සී. 5 | ජීවනාධාර සහ විශේෂ දීමනා ... ... | 300 | 0 |
| ඩී. 1 | වැටුප් ... ... ... | 650 | 0 |
| ඩී. 4 | නඩත්තුව ... ... ... | 3,000 | 0 |
| ඩී. 5 | ද්‍රව භාණ්ඩ ... ... ... | 500 | 0 |
| ඊ. 1 (ඒ) | වැටුප් (පරීක්ෂකවරුන්ගේ සහ වින්නඹු මාතාවන්ගේ ) පඩිනඩි | 1,800 | 0 |
| එෆ්. 2 | නඩත්තුව ... ... ... | 1,000 | 0 |
| ජේ. 2 (ඩී) | විදුලි බලය සපයන සහ බෙදා හරින කම්බි නඩත්තු කිරීම | 2,000 | 0 |
| | | 34,215 | 0 |

ඇස්. ජී. ඒ. ද සිල්වා,
අම්බලන්ගොඩ නගර සභාවේ සභාපති.

නගර සභා කාර්යාලය,
අම්බලන්ගොඩ,
1965 නොවැම්බර් මස 5 වැනි දින.

11-802/1—65.11.19 දින අංක 14,561 දරන ගැසට් පත්‍රය

---

## අම්බලන්ගොඩ නගර සභාව

**පළමුවැනි අතිරේක අය-වැය ලේඛනය—1965**

| වැය ශීර්ෂයන් | | මුදල් රු. | ශ. | අනුග්‍රාහක බලය |
|---|---|---|---|---|
| ඇම්. 3 | ද්‍රව භාණ්ඩ ... ... | 300 | 0 | ... 20.2.65 දින රැස්වීමේ සම්මුති අංක 8 |
| ඩී. 7 | අළුත් වැඩ ... ... | 6,700 | 0 | ... 27.3.65 දින රැස්වීමේ සම්මුති අංක 14 |
| ඊ. 5 (ඩී) | ඉඩම් ලබා ගැනීම ... ... | 500 | 0 | ... 22.5.65 දින රැස්වීමේ සම්මුති අංක 10 |
| ඒ. 1 (ඊ) | විශ්‍රාම වැටුප් ... ... | 1,448 | 0 | ... 22.5.65 දින රැස්වීමේ සම්මුති අංක 25 |
| ඒ. 2 (කේ) | ජීවනාධාර සහ විශේෂ ජීවනාධාර දීමනා වියදම් | 1,322 | 0 | ... 22.5.65 දින රැස්වීමේ සම්මුති අංක 25 |
| බී. 8 | සංවර්ධනය ... ... | 8,000 | 0 | ... 26.6.65 දින රැස්වීමේ සම්මුති අංක 33 |
| සී. 4 | සංවර්ධනය ... ... | 2,000 | 0 | ... 24.7.65 දින රැස්වීමේ සම්මුති අංක 19 |
| බී. 8 | සංවර්ධනය ... ... | 10,000 | 0 | ... 28.8.65 දින රැස්වීමේ සම්මුති අංක 12 |
| ඒ. 2 (ඇල්) | අතිකාල දීමනා ... ... | 500 | 0 | ... 28.8.65 දින රැස්වීමේ සම්මුති අංක 22 |
| ඩී. 4 | නඩත්තුව ... ... | 1,000 | 0 | ... 28.8.65 දින රැස්වීමේ සම්මුති අංක 7 |
| ඒ. 2 (ඊ) | අධිකරණ ගාස්තු ... ... | 500 | 0 | ... 18.9.65 දින රැස්වීමේ සම්මුති අංක 13 |
| | | 32,270 | 0 | |

ඇස්. ජී. ඒ. ද සිල්වා,
අම්බලන්ගොඩ නගර සභාවේ සභාපති.

1965 ඔක්තෝබර් මස 22 වෙනි දින,
අම්බලන්ගොඩ නගර සභා කාර්යාලයේදීය.

11-802/2—65.11.19 දින අංක 14,561 දරන ගැසට් පත්‍රය

## පොල්ගහවෙල සුළු නගර සභාව

මුදල් රෙගුලාසි 40(II) යටතේ ඉල්ලුම් පත්‍රයයි

1965—අය–වැය ලේඛනය

1 වැනි කොටස

1965 වර්ෂයේ අයවැය ලේඛනයේ මුදල් ඉතිරිවේ යයි ගණන් බලා ඇති වැය ශීර්ෂයන්ගෙන් වැය ඉක්මවා යන ශීර්ෂයන්ට මෙහි පහත පෙන්වන පරිදි මුදල් මාරු කිරීමට 1965 ඔක්තෝබර් මස 14 වැනි දින පවත්වන ලද මාසික රැස්වීමේ අංක 4 දරණ සභා තීරණයෙන් සභා සම්මත කර ගන්නා ලදී.

| ඉතිරි වේයයි ගණන් බලා ඇති උප ශීර්ෂ | | රු. ශ. |
|---|---|---|
| බී. (2) | නඩත්තු කිරීම ... ... | 891 0 |
| බී. (14) | බස් නැවතුම් පොල හා බස් නවතන ස්ථාන | 850 0 |
| ඩී. (5) (ඩී) | අත්පත් කර ගැනීම ... ... | 750 0 |
| ඩී. (5) (එච්) | ප්‍රසිද්ධ නාන ස්ථාන ... ... | 524 0 |
| | | 3,015 0 |

| වැඩිපුර මුදල් අවශ්‍යව ඇති උප ශීර්ෂ | | රු. ශ. |
|---|---|---|
| ඊ. (8) | දියුණු කිරීම ... .. | 3,015 0 |
| | | 3,015 0 |

ආර්. ඒ. සිරිසේන,
සභාපති,
සුළු නගර සභාව, පොල්ගහවෙල.

සුළු නගර සභා කාර්යාලය,
පොල්ගහවෙල,
1965.11.11.

11–848—65.11.19 දින අංක 14,561 දරන ගැසට් පත්‍රය

---

## බෙලිඅත්ත සුළු නගර සභාව

1965 වර්ෂයේ දෙවැනි අතිරේක අයවැය ලේඛනය

දෙවන කොටස—විදුලි යෝජනා ක්‍රමය

වැය ශීර්ෂ

| | රු. ශ. |
|---|---|
| ඊඞී. 2 (බී) අළුත්වැඩියා කිරීම හා නඩත්තුව : එන්ජින්, බොයිලේරු ආදිය ... ... | 7,550 0 |

1965.9.14 වැනි දින පවත්වන ලද මාසික සභා රැස්වීමේදී මෙය පිළිගත්ට යෙදුනා ඇත.

ටී. එච්. සෝමදාස,
සභාපති,
බෙලිඅත්ත සුළු නගර සභාව.

සුළු නගර සභා කාර්යාලය,
බෙලිඅත්ත, 1965.11.2.

අනුමත කරන ලදී.

එච්. ඒ. පී. අභයවර්ධන,
පළාත් පාලන උප කොමසාරිස්,
මාතර.

1965.11.11

11–853—65.11.19 දින අංක 14,561 දරන ගැසට් පත්‍රය

---

## බෙලිඅත්ත සුළු නගර සභාව

මුදල් රෙගුලාසි අංක 40(II) දරන කොටස යටතේ අයදුම් පත

වර්ෂ 1965 අය–වැය කෙටුම්පත

පහත දක්වෙන ඉතිරි මුදල් යටතේ සඳහන් ශීර්ෂයන්ගේ මුදල ඒ හා සමඟ දක්වෙන වැඩිපුර වියදම් යටතේ සඳහන් ශීර්ෂවලට මාරුකර ඉන් වැය කිරීමට 1965 ක්වූ සැප්තැම්බර් මස 14 වැනි දින පවත්වන්ට යෙදුන සභා රැස්වීමේදී, පළාත් පාලන සහකාර කොමසාරිස්තුමාගේ අනුමැතිය බලාපොරොත්තු වෙන් සභා සම්මත කරගන්නා ලදී.

ටී. එච්. සෝමදාස,
සභාපති,
බෙලිඅත්ත සුළු නගර සභාව.

සුළු නගර සභා කාර්යාලය,
බෙලිඅත්ත, 1965.9.30.

| ඉතිරි වැය | | රු. ශ. |
|---|---|---|
| ඒ. (2) (ජී) | රථවාහන ලයිසන් කහඩු ... | 18 50 |
| ඒ. (2) (කේ) | කාර්යාලීය බඩු බාහිරාදිය ... | 400 0 |
| ඒ. (2) (එම්) | නිළ ඇඳුම් ... ... | 40 0 |
| ඩී. (1) (කේ) | කිරි පරීක්ෂාකිරීමේ ගාස්තු ... | 100 0 |
| ඩී. (1) (ඇන්) | මාතෘදරකාහිවෘද්ධි නිවාසය ... | 300 0 |
| ජී. (1) | බල්ලන් විනාශකිරීම ... ... | 50 0 |
| අයි. (1) | ගිණිවුවදුරු මැඩලීම ... ... | 41 50 |
| | | 950 0 |

| අතිරේක වැය | | රු. ශ. |
|---|---|---|
| ඒ. (1) (බී) | ලිපිකරු වැටුප් ... ... | 200 0 |
| ඒ. (2) (ඇජ්) | ලිපිද්‍රව්‍ය ... ... | 450 0 |
| ඒ. (2) (අයි) | නිවාඩු දුම්රිය බලපත්‍ර ... ... | 300 0 |
| | | 950 0 |

අනුමත කරන ලදී.

එච්. ඒ. පී. අභයවර්ධන,
පළාත් පාලන උප කොමසාරිස්—මාතර.

1965.11.11

11–854—65.11.19 දින අංක 14,561 දරන ගැසට් පත්‍රය

## දන්කොටුව සුළු නගර සභාව

### අයවැය වාර්තාව—1966

### 1 වන කොටස—සාමාන්‍ය අයවැය විස්තරය

| ආදායම් ශීර්ෂ | 1966 ට ගණන් බැලීම රු. ශ. | එකතුව රු. ශ. |
|---|---|---|
| ඒ.—සාමාන්‍ය :— | | |
| 1. උද්පල බදු ... ... | 13,500 0 | |
| 2. රථවාහන හා සත්ව බදු ... | 180 0 | |
| 3. බලපත්‍ර ගාස්තු ... ... | 3,495 0 | |
| 4. වෙනත් බදු ... ... | — | |
| 5. මුද්දර ගාස්තු ආපසු ගෙවීම් ... | 108 0 | |
| 6. මත්පැන් බලපත්‍ර ගාස්තු ආපසු ගෙවීම ... | — | |
| 7. අබිං ආදායමට වන්දි ... ... | — | |
| 8. උසාවි දඩ ... ... | — | |
| 9. වෙන්දේසි හා තරවකාර බලපත්‍ර ... | — | |
| 10. පොළී ... ... | — | |
| 11. පරණ දෑ අලෙවිය ... ... | — | |
| 12. වැඩිපුර ගෙවීම් ආපසු ගෙවීම් ... | — | |
| 13. වරිපණම් දඩ මුදල් ... ... | 300 0 | |
| 14. ජීවන හා විශේෂ ජීවනාධාර දීමනා ... | 16,371 0 | |
| 15. මිශ්‍ර ආදායම් ... ... | 200 0 | |
| 16. පොදු ආධාර මුදල ... ... | 8,000 0 | |
| | | 42,154 0 |
| බී.—විශ්‍රාම වැටුප් :— | | |
| 1. කම්කරු බදු වෙනුවට ආධාර මුදල ... | 1,411 0 | |
| 2. වෙනත් එකතු කිරීම් ... ... | — | |
| | | 1,411 0 |
| සී.—නගර සභා සතු ඉඩම් සහ ගොඩනැගිලි :— | | |
| 1. කුලී ... ... ... | 180 0 | |
| 2. පලදාව විකිණීම් ... ... | 300 0 | |
| 3. ඉඩම් විකිණීම් ... ... | — | |
| | | 480 0 |
| ඩී.—මහජන සෞඛ්‍යය :— | | |
| 1. සාමාන්‍ය— | | |
| (ඒ) 4 වටයේ දඩ ... ... | — | |
| (බී) වින්නඹු මාතාවගේ සේවය සඳහා ගාස්තු ... ... | — | |
| (සී) මාතෘ හා දාරකාභිවෘද්ධි මධ්‍යස්ථාන— | | |
| (1) රජයේ ප්‍රදාන ... ... | 700 0 | |
| (2) වෙනත් ... ... | 5 0 | |
| 2. කැලි කසල සෝධනය— | | |
| (ඒ) ගාස්තු ... | — | |
| (බී) අප්‍රයෝජන දෑ අලෙවිය ... | — | |
| (සී) කොන්ත්‍රාත් කරුවන්ගෙන් හා කම් කරුවන්ගෙන් දඩ ... | — | |
| 3. වැසිකිළි සෝධනය— | | |
| (ඒ) කුලී ... ... | — | |
| (බී) ගාස්තු ... ... | 540 0 | |
| (සී) අප්‍රයෝජන දෑ අලෙවිය ... | — | |
| (ඩී) කොන්ත්‍රාත්කරුවන්ගේ හා කම්කරුවන්ගේ දඩ ... ... | — | |
| 4. ගෝඝාතක ස්ථාන සහ ගවගාල්— | | |
| (ඒ) ගාස්තු ... | 570 0 | |
| (බී) අප්‍රයෝජන දෑ අලෙවිය ... | — | |
| 5. ජල සම්පාදනය— | | |
| (ඒ) ජල සම්පාදන ගාස්තු ... | — | |
| (බී) පුද්ගලික ජල සම්පාදන ගාස්තු ... | — | |
| (සී) තහනම් කිරීමේ ගාස්තු ... | — | |
| (ඩී) පාරිභෝගික කර්මාන්ත සඳහා ගාස්තු | — | |
| (ඊ) මාපක කුලී ... ... | — | |
| (ඈෆ්) පුද්ගලික ජල සම්පාදන ගාස්තු ... | — | |
| 6. රෝහල්— | | |
| (ඒ) රජයේ ආධාර මුදල් ... | — | |
| (බී) ආරෝග්‍යශාලා බිම් කුලිය ... | — | |
| 7. ප්‍රසිද්ධ වෙළඳසැල් හා ගාල්— | | |
| (ඒ) කුලී ... ... | 900 0 | |
| (බී) කඩ හා වෙළඳ මැසි ... | 5,400 0 | |
| (සී) පොදු වෙළඳපලවල් බලපත්‍ර ... | 250 0 | |
| (ඩී) බලපත්‍ර ... ... | — | |
| (ඊ) ධාන්‍ය ගබඩා කුලිය ... | — | |
| | | 8,374 0 |

| ආදායම් ශීර්ෂ | 1966 ට ගණන් බැලීම රු. ශ. | එකතුව රු. ශ. |
|---|---|---|
| ඊ.—මහජන විනෝදය :— | | |
| 1. කුලී ... ... ... | — | |
| 2. තණබිම් ගාස්තු ... ... | — | |
| 3. මහජන විනෝද බලපත්‍ර ... | 450 0 | |
| 4. විනෝද බදු ... ... | 10,000 0 | |
| | | 10,450 0 |
| ඈෆ්.—සුසාන භූමි :— | | |
| 1. ගාස්තු ... ... | — | |
| 2. මිනී රථ කුලී ... ... | — | |
| 3. ස්මාරක ඉදි කිරීම සඳහා බිම් විකිණීම | — | |
| ජී.—සුනඛයින් ලියා පදිංචි කිරීම :— | | |
| 1. බල්ලන් ලියා පදිංචි කිරීමේ ගාස්තු ... | 100 0 | |
| 2. දඩ ... ... ... | — | |
| 3. සුනඛ කරපටි විකිණීම ... | — | |
| 4. සුනඛයින් ඇල්ලීමේ ගාස්තු ... | — | |
| | | 100 0 |
| එච්.—කිරුම් හා මිනුම් :— | | |
| 1. මුද්‍රා තැබීමේ ගාස්තු ... ... | — | |
| 2. දඩ ... ... | — | |
| අයි.—ගින්නෙන් ආරක්ෂා කිරීම :— | | |
| 1. ගාස්තු ... ... | — | |
| ජේ.—කියවීම් ශාලා හා පුස්තකාල :— | | |
| 1. ආධාර මුදල් ... ... | — | |
| 2. දායක මුදල් ... ... | — | |
| මුළු එකතුව ... | | 62,969 0 |

| වියදම් ශීර්ෂ | 1966 ට ගණන් බැලීම රු. ශ. | එකතුව රු. ශ. |
|---|---|---|
| ඒ.—සාමාන්‍ය වියදම් :— | | |
| 1. නිලධාරීන්ගේ වැටුප්— | | |
| (ඒ) ලේකම් ... ... | 2,320 0 | |
| (බී) ලිපිකරුවෝ ... ... | 2,195 0 | |
| (සී) ආදායම් පරීක්ෂකයෝ ... | 1,380 0 | |
| (ඩී) කාර්යාල කාර්ය සහායකයින් ... | 645 0 | |
| (ඊ) කාර්මික උපදේශක ගාස්තු ... | — | |
| (ඈෆ්) විශ්‍රාම වැටුප් ... ... | — | |
| (ජී) ජීවනාධාර හා විශේෂ ජීවනාධාර ... | 5,700 0 | |
| 2. සංස්ථා වියදම්— | | |
| (ඒ) දීමනා (අන් අන්දමකින් වෙන් නොකළ) ... ... | 910 0 | |
මහරගම නගර සභා ප්‍රදේශය ඇතුළත ඇති කරන සෑම බල්ලෙකුටම රු. 1.00 ක සහ සෑම බැල්ලකටම රු. 1.50 ක ලියාපදිංචි කිරීමේ බද්දක්, 1966 වර්ෂය සඳහා අයකිරීමට සුනඛයින් ලියාපදිංචි කිරීමේ ආඥා පනතේ (477 පරිච්ඡේදය) 4 වෙනි ඡේදය යටතේ, මහරගම නගර සභාව විසින් පනවා ඇති බවත්, එම බද්ද 1966 මාර්තු මස 31 වෙනි දිනට පෙර ගෙවිය හැකි බවත්, මහරගම නගර සභාව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ඩබ්ලිව්. සිරිසේන පෙරේරා,
සභාපති,
මහරගම නගර සභාව.

1965 නොවැම්බර් මස 11 වෙනි දින,
නගර සභා කාර්යාලය,
මහරගම.

11-791/2—65.11.19 දින අංක 14,561 දරන ගැසට් පත්‍රය

---

## මහරගම නගර සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත දක්වෙන උප ලේඛණයේ සඳහන් අය විසින්, මස් පිණිස සතුන් මරා මස් විකිණීම සඳහා 1966 වර්ෂයට බලපත්‍රයක් ඉල්ලුම් කර තිබෙන හෙයින්, ඒ අනුව බලපත්‍ර නිකුත් කිරීම ගැන මහරගම නගර සභා ප්‍රදේශය තුළ පදිංචි යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම්, එසේ විරුද්ධවීමට හේතු සඳහන් කර පිටපත් දෙකකින් යුත් ලියවිල්ලකින් මෙම දන්වීම ගැසට් පත්‍රයෙහි පළවූ දින සිට දින 14 ක් ඇතුළත මා වෙත ලියා එවීමට බලය තිබෙන බවත්, මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥා පනතේ (272 පරිච්ඡේදය) අංක 7 දරණ වගන්තිය යටතේ මෙයින් දනුම් දෙමි.

### උප ලේඛනය

| ඉල්ලුම් කරුගේ නම සහ ලිපිනය | වෙළඳාම | ස්ථානය |
|---|---|---|
| ඩබ්ලිව්. ඇල්. පෙරේරා මහතා, 494, රුක්මලේ පාර, පන්නිපිටිය ... | හරක් මස් | ... මහරගම පොදු වෙළඳ පොළේ අංක 1 හරක් මස් කඩය |
| ඇම්. ඇස්. ඇම්. යුසුප් මහතා, අංක 4, එළුමස් කඩය, වැල්ලවත්ත වෙළඳ පොළ, වැල්ලවත්ත | හරක් මස් | ... මහරගම පොදු වෙළඳ පොළේ අංක 2 හරක් මස් කඩය |
| ඇම්. ඒ. ඇල්. නාජුඩීන් මහතා, 34, ප්‍රධාන වීදිය, මොරටුව ... ... | එළු මස් | ... මහරගම පොදු වෙළඳ පොළේ එළු මස් කඩය |
| ඇම්. ඇස්. ඇම්. හනීෆා මහතා, 166/11, නාරාහේන්පිට පාර, බොරැල්ල ... | කුකුළු මස් | ... මහරගම පොදු වෙළඳ පොළේ කුකුළු මස් කඩය |

ඩබ්ලිව්. සිරිසේන පෙරේරා,
සභාපති,
මහරගම නගර සභාව.

1965 නොවැම්බර් මස 11 වෙනි දින,
නගර සභා කාර්යාලය,
මහරගම.

11-791/3—65.11.19 දින අංක 14,561 දරන ගැසට් පත්‍රය

## පුන්ඩලුඔය උප නගර සභාව

### 1966 වර්ෂයට සුනඛයන් සඳහා බද්ද

### සුනඛයන් ලියාපදිංචි කිරීමේ ආඥාපනත (477 වැනි පරිච්ඡේදය)

සුනඛයින් ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ (477 වැනි පරිච්ඡේදය) 4 වැනි වගන්තිය යටතේ පුන්ඩලුඔය උප නගර සභා බලමණ්ඩලය තුළ තබාගෙන සිටින සෑම බල්ලෙක් සඳහා රුපියල් 1 බැගින් ද, බැල්ලක් සඳහා රු. 1.50 බැගින් ද 1966 මාර්තු 31 වැනිදා හෝ ඊට පෙර ගෙවන අයුරින් ලියාපදිංචි කිරීමේ ගාස්තුවක් පනවා ඇය කිරීමට පුන්ඩලුඔය උප නගර සභාව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ඊ. පී. ඒ. ප්‍රැන්සිස් අප්පුහාමි,
සභාපති.

1965 නොවැම්බර් මස 9 වැනි දින,
පුන්ඩලුඔය උප නගර සභා කාර්යාලයේ දීය.

11–821—65.11.19 දින අංක 14,561 දරණ ගැසට් පත්‍රය

---

## පුන්ඩලුඔය උප නගර සභාව

### 1966 වර්ෂයට දේපොල බද්ද

උප නගර සභා ආඥාපනතේ (256 වැනි අධිකාරය) යටතේ ගතවී යන මෙම වර්ෂයට බලපවත්නා පහත සඳහන් දේපල බදු 1966 වර්ෂයටද එලෙසම පැනවීමට පුන්ඩලුඔය උප නගර සභාව තීරණය කර ඇති බව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

159 වැනි වගන්තිය ප්‍රකාර මෙම උප නගර සභා සීමාව තුළ පිහිටා තිබෙන සියලුම නිශ්චල දේපලවල වාර්ෂික වටිනාකමින් සියයට නමය බැගින් වූ වාර්ෂික බදු පිළිවෙලින් මාර්තු 31 වැනිදයින්, ජූනි 30 වැනිදායින්, සැප්තැම්බර් 30 වැනිදායින් හා දෙසැම්බර් 31 වැනි දායින් අවසන්වන අයුරින් කාර්තු වශයෙන් ගෙවිය හැකිවේ.

ඊ. පී. ඒ. ප්‍රැන්සිස් අප්පුහාමි,
සභාපති.

1965 නොවැම්බර් මස 9 වැනි දින,
පුන්ඩලුඔය උප නගර සභා කාර්යාලයේ දීය.

11–820—65.11.19 දින අංක 14,561 දරන ගැසට් පත්‍රය

---

## යටියන්තොට සුළු නගර සභාව

### 1966 වර්ෂයේ සුනඛයින් ලියාපදිංචි කිරීමේ ගාස්තු

### සුනඛයින් ලියාපදිංචි කිරීමේ ආඥාපනත (477 වැනි පරිච්ඡේදය)

සුනඛයින් ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ (477 වැනි පරිච්ඡේදය) 4 වැනි වගන්තිය ප්‍රකාර යටියන්තොට සුළු නගර සභා සීමාව තුළ තබාගන්නා සෑම බල්ලෙකු වෙනුවෙන් රු. 1ක්ද, බැල්ලියකු වෙනුවෙන් රු. 1.50ක් ද ලියාපදිංචි කිරීමේ ගාස්තු වශයෙන් 1966 වර්ෂයට පනවා ඇති බවද එකී ගාස්තු 1966 මාර්තු මස 31 වැනි දින හෝ ඊට පෙර ගෙවිය යුතු බවද මෙයින් දැනුම් දෙනු ලැබේ.

වී. දවිත් සිංඤෝ,
සභාපති,
යටියන්තොට සුළු නගර සභාව.

1965 නොවැම්බර් මස 4 වැනි දින,
යටියන්තොට, සුළු නගර සභා කාර්යාලයේ දීය.

11–805—65.11.19 දින අංක 14,561 දරන ගැසට් පත්‍රය

---

## අගංගම සුළු නගර සභාව

### 1966 වර්ෂයේ වරිපනම් ලේඛන

1966 වර්ෂය සඳහා සුළු නගර සභාවේ වරිපනම් ලේඛන දැනට සූදානම්ව ඇති බවත්, එම ලේඛන කාර්යාලීය වේලාවන්හිදී මෙම සුළු නගර සභා කාර්යාලයේ දී පරීක්ෂා කර බැලීම සඳහා තබා ඇති බවත්, 1946 අංක 3 දරණ සුළු නගර සභා ආඥා පනතේ 165 වැනි වගන්තියන් කියවෙන පරිදි 1947 අංක 29 දරණ මහා නගර සභා ආඥා පනතේ 235 (1) වැනි වගන්තිය අනුව මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඉ. තන්දිපාල,
සභාපති,
අගංගම සුළු නගර සභාව.

1965 නොවැම්බර් මස 3 වැනි දින,
අගංගම සුළු නගර සභා කාර්යාලයේ දීය.

11–804—65.11.19 දින අංක 14,561 දරන ගැසට් පත්‍රය

---

## කටුනායක පළාත් ආණ්ඩු සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත සඳහන් උපලේඛනයෙහි සඳහන් අය විසින් 1966 වර්ෂයට මස් කඩයක් පවත්වා ගෙන යාමට බලපත්‍රයක් ඉල්ලුම් කර සිටින බවත්, ඒ අනුව බලපත්‍රයක් නිකුත් කිරීම ගැන කටුනායක පළාත් ආණ්ඩු සභා ප්‍රදේශය තුල පදිංචි යම් කෙනෙක් විරුද්ධ වන්නේනම් එසේ විරුද්ධ වීමට හේතු දක්වා පිටපත් දෙකකින් යුත් ලියවිල්ලක් මෙම දන්වීම ගැසට් පත්‍රයෙහි පලවූ දින සිට දින 14ක් ඇතුලත මා වෙත ලියා එවීමට බලය තිබෙන බවත්, එසේ මස් මරන්නන් පිළිබඳ ආඥාපණතේ (272 වෙනි අධිකාරයේ) අංක 7 දරණ වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබෙ.

### උපලේඛනය

| | ඉල්ලුම්කරුගේ නම | වෙළඳාම | ස්ථානය |
|---|---|---|---|
| 1. | යූ. ඇස්. ඇස්. මොහමඩ් මයා. ... ... | ... හරක්මස් වෙළඳාම ... | අංක 41/5, මහනුවර පාර, කටුනායක |
| 2. | ඇම්. එච්. කරීම් මයා. ... ... | ... එළුමස් වෙළඳාම ... | අංක 41/1, මහනුවර පාර, කටුනායක |

ජෝර්ජ් ගුනසේකර,
සභාපති වෙනුවට,

පළාත් ආණ්ඩු සභා කාර්යාලය,
කටුනායක, 1965.11.12.

11–838—65.11.19 දින අංක 14,561 දරන ගැසට් පත්‍රය

## පැල්මඩුල්ල සුළු නගර සභාව

### පිස්සු බලු උවදුර

ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල (476) වැනි පරිච්ඡේදයේ පිස්සු බලු උවදුර පිළිබඳ ආඥාපනතේ 11 වැනි වගන්තිය ප්‍රකාර පැල්මඩුල්ල සුළු නගර සභා සීමාව තුළ පිස්සු බලු උවදුර පැතිර පවතින්නා බව මෙයින් නිවේදනය කරමි.

පැල්මඩුල්ල සුළු නගර සභා සීමාව තුළ ඕනෑම දුසිද්ධ ස්ථානයක, පාරක හෝ පෞද්ගලික ස්ථානයක නොවින ඕනෑම ස්ථානයක, මිදුලක හෝ ඉඩමක නිසියාකාර නොබදින ලද, එසේ නොවැති නම් භාරකරුවකු නොමැති බල්ලෙකු හෝ බැල්ලියක දුටු විගස මා විසින් ලියවිල්ලකින් දෙන ලද බලය ලත් ඕනෑම අයෙකු විසින් මරා දැමීමට බලය තිබෙන බව මෙයින් දැනුම් දෙමි.

මෙම ප්‍රකාශනය වර්ෂ 1966 ක්වූ මාර්තු මස 31 වෙනි දින දක්වා බල පවත්වනවා ඇත.

ඒ. සී. ඇම්. ඒ. මරික්කාර්,
සභාපති.

1965 නොවැම්බර් මස 11 වැනි දින,
පැල්මඩුල්ල සුළු නගර සභා කාර්යාලයේ දිය.

11-850—65.11.19 දින අංක 14,561 දරන ගැසට් පත්‍රය

---

## පාතදුම්බර පල්ලේගම්පහ ගම්සභාව - මහනුවර

### මස් පිණිස සතුන් මැරීම පිළිබඳ ආඥාපනත

මෙහි පහත දක්වෙන උපලේඛනයේ නම් සඳහන් අයවලුන් විසින් එහි දක්වෙන ස්ථානවල 1966 වර්ෂයට මස් කඩ පවත්වාගෙන යාම සඳහා බලපත්‍ර ඉල්ලුම්කර ඇති බවත්, එම බලපත්‍ර නිකුත් කිරීම ගැන මහනුවර දිස්ත්‍රික්කයේ පාතදුම්බර පල්ලේගම්පහ ගම්සභා ප්‍රදේශය තුළ පදිංචි ඕනෑම කෙනෙකුගේ විරුද්ධත්වයක් ඇත්නම් එය විස්තර සහිතව ලියවිල්ලකින් පිටපත් දෙකක් සිටිනසේ සකස් කොට මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවින දින සිට දින 14 ක් ඇතුළත මා වෙත ලැබෙන්ට සැලැස්විය යුතු බව මස් පිණිස සතුන් මැරීම පිළිබඳ ආඥාපනතේ (272 වැනි අධිකාරය) 7 (2) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | වෙළඳාම | ස්ථානය |
|---|---|---|
| 1. ඇන්. ඇල්. ඒ. ලතීෆ්, නො. 53, පන්විල ... | ... හරක් මස් | ... අංක 53, වෙට්ටවා පේන, පන්විල |
| 2. ඇම්. ඇස්. ඒ. මොහමඩ්, අංක 422, වරාගස්හින්න, අකුරණ | ... හරක් මස් | ... අංක ඒ/78, කුරුඳුගහඇල |
| 3. ආර්. ඒ. හබීබු මුහම්මදු, කුරුඳුගහඇල, අකුරණ ... | ... හරක් මස් | ... අංක 207, කුරුඳුගහඇල |
| 4. එයි. ඇල්. ඇස්. ඇම්. දීන්, කට්ගස්තොට ... | ... හරක් මස් | ... අංක 66, නවයාලතැන්න |
| 5. කේ. මොහිදීන් මීරස්සා, 220, පන්විල ... | ... එළු මස් | ... අංක 220, පන්විල |
| 6. ඇච්. සී. හාලින්, නො. 7, මඩවල ... ... | ... හරක් මස් | ... ගලගිරියා වත්ත, උඩතලවින්න, මඩිගේ |
| 7. ඇම්. ඇස්. ඒ. මහරූෆ්, 422, වරාගස්හින්න, අකුරණ | ... හරක් මස් | ... කැප්පිටිගොඩ වත්ත, අඹතැන්න |

ඇම්. කරුණාරත්න,
පාතදුම්බර පල්ලේගම්පහ ගම්සභාවේ සභාපතිතැන.

ගම්සභා කාර්යාලය,
නවයාලතැන්න, කට්ගස්තොට,
1965.11.12.

11-861—65.11.19 දින අංක 14,561 දරන ගැසට් පත්‍රය

---

## පදවිගම්පොල ගම්සභාව

### මස් පිණිස සතුන් මැරීම පිළිබඳ ආඥාපනත

මෙහි පහත දක්වෙන උපලේඛනයේ නම් සඳහන් අය විසින් එහි දක්වෙන ස්ථානයෙහි 1966 යේ වර්ෂයට මස් කඩයක් පවත්වාගෙන යාම සඳහා බල පත්‍රයක් ඉල්ලුම් කර ඇති බවත්, එම බලපත්‍රය නිකුත් කිරීම ගැන කෑගල්ල දිස්ත්‍රික්කයේ පදවිගම්පොල ගම්සභා ප්‍රදේශය තුළ ඕනෑම කෙනෙකුගේ විරුද්ධත්වයක් ඇත්නම් එය විස්තර සහිතව ලියවිල්ලකින් පිටපත් දෙකක් සිටිනසේ සකස්කොට මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවුන දින සිට දින 14 ක් ඇතුලත මාවෙත ලැබෙන්ට සැලැස්විය යුතු බැව් මස් පිණිස සතුන් මිරන්නන් පිළිබඳ ආඥාපණතේ (272 වැනි අධිකාරය) 7 වැනි වගන්තිය යටතේ මෙයින් දනුම් දෙමි.

### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | වෙළඳාම | ස්ථානය |
|---|---|---|
| 1. ඇන්. ඇම්. ඒ. සත්තාර්, අංක 4, වෙළඳ පොල, රඹුක්කන | ... හරක් මස් | ... ජාහොඩියෑ කොටුව, හේවාදිවෙල |

ඩී. ආනන්ද සිරිසේන,
පදවි ගම්පොල ගම්සභාවේ සභාපති.

වර්ෂ 1965 ක්වූ නොවැම්බර් මස 5 වෙනි දින,
වහලේ පිහිටි පදවිගම්පොල ගම්සභා කාර්යාලයේ දිය,
රඹුක්කන.

11-806—65.11.19 දින අංක 14,561 දරන ගැසට් පත්‍රය

---

## කන්ද පල්ල කෝරළේ ගම්සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත උපලේඛනයෙහි නම් සඳහන් අයවලුන් එහි සඳහන් කර තිබෙන ස්ථානවල 1966 වර්ෂයට මස් පිණිස සතුන් මරා විකිණීමට බලපත්‍ර ඉල්වා ඉල්ලුම්පත්‍ර මා වෙත එවා තිබෙන බව මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ 201 වැනි පරිච්ඡේදයේ 1947 අංක 44 දරණ සංශෝධිත ආඥාපනතේ 6 වන වගන්තියෙන් සංශෝධිත කරන ලද 7 වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

2. එකී බලපත්‍ර නිකුත් කිරීම ගැන, කන්ද පල්ල කෝරළේ ගම් ප්‍රදේශයේ ගම්සභා සීමාව තුළ පදිංචි යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම් ඔහු හෝ ඇ එසේ විරුද්ධවන්නේ කුමන හේතුන් නිසාද යන බව සඳහන් ලියවිල්ලක් පිටපත් දෙකක් සහිතව මෙම ගැසට් පත්‍රයේ පළවූ දින සිට දහහතර දිනක් ඇතුලත මා වෙත එවිය යුතු බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | ස්ථානය සහ වෙළඳාම |
|---|---|
| 1. ඊ. බදුර්දීන් තබ්බගහවත්ත, ගැල්වෙල | ඉහිනිගහපිලවත්ත, තබ්බගහ වත්ත. එළුහරක් මස් |
| 2. අයි. ජේ. හමීසා ලෙබ්බෙ, බුලනවැව, දේවහුව | මුස්ලිම් කොළනිය, බුලනවැව. එළුහරක් මස් |

සී. බී. අළුවිහාරේ,
සභාපති.

කන්ද පල්ල කෝරළේ ගම්සභාව,
පට්ටපිටිය, ගැල්වෙල,
1965 නොවැම්බර් 10.

11-796—65.11.19 දින අංක 14,561 දරන ගැසට් පත්‍රය

## බෙලිඅත්ත සුළු නගර සභාව

1966 වර්ෂය සඳහා සුනඛ බදු

### සුනඛයින් ලියා පදිංචි කිරීමේ ආඥා පනත (477 වෙනි පරිච්ඡේදය)

සුනඛයින් ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ (477 වෙනි පරිච්ඡේදයේ) 4 වැනි වගන්තිය යටතේ, මෙම සුළු නගර සභා සීමාව තුළ තබාගෙන සිටින සෑම පිරිමි සුනඛයෙක් සඳහා රුපියල් 1 ක් බැගින්ද, සෑම ගැහැණු සුනඛයෙක් සඳහා රුපියල් 1ක් බැගින්ද, ලියාපදිංචි කිරීමේ ගාස්තුවක් 1966 වර්ෂයට අයකිරීමට පනවා ඇති බව බෙලිඅත්ත සුළු නගර සභාව මෙයින් ප්‍රකාශනයට පත්කරනු ලැබේ.

ඊ. එච්. යෝමදාස,
සභාපති,
බෙලිඅත්ත සුළු නගර සභාව.

සුළු නගර සභා කාර්යාලය,
බෙලිඅත්ත, 1965.11.5.

11-826/1—65.11.19. දින අංක 14,561 දරන ගැසට් පත්‍රය.

---

## බෙලිඅත්ත සුළු නගර සභාව

1966 වර්ෂය සඳහා රථවාහන හා සතුන් පිළිබඳ බදු

### 1946 අංක 3 දරණ සුළු නගර සභා ආඥාපනත

බෙලිඅත්ත සුළු නගර සභාව මෙයින් ප්‍රකාශනයට පත්කරනු ලබන්නේ :—

(1) 1946 යේ අංක 3 දරණ සුළු නගර සභා ආඥාපනතේ 161 දරණ වගන්තිය යටතේ, 1966 වර්ෂයට පහත උපලේඛනයේ විස්තර වන ගණන් අනුව රථවාහන හා සතුන් පිළිබඳ බද්දක් පනවා අය කිරීමද, එම ගාස්තු 1965 වර්ෂයේ බල පැවති ගාස්තුවලට සමාන බැවිද,

(2) එකී ආඥාපනතේ අංක 162 (3) යටතේ එකී බදු 1966 මාර්තු මස 31 වෙනිදාට හෝ ඊට පෙරාතුව ගෙවිය හැකි අයුරින්ද වේ.

ඊ. එච්. යෝමදාස,
සභාපති,
බෙලිඅත්ත සුළු නගර සභාව.

සුළු නගර සභා කාර්යාලය,
බෙලිඅත්ත. 1965.11.5.

### උපලේඛනය

| | රු. ශ. |
|---|---|
| මෝටර් කාර්, මෝටර් රෝදතුනේ කාර්, ලොරි, මෝටර් පාපැදි, කරත්ත, අත් කරත්ත, රික්ෂෝ රථ, පාපැදි හෝ රෝදතුනේ පාපැදි හැර වෙනයම් ඕනෑම වාහනයක් සඳහා ... ... | 5 00 |
| සෑම පාපැදියක්, රෝදතුනේ පාපැදියක්, හෝ පාපැදි මෝටර් රථයක්, හෝ කරත්තයක් නොහොත් රෝදතුනේ පාපැදියක් හෝ කරත්තයක් : | |
| (ඒ) වෙළඳාම සඳහා පාවිච්චි කෙරේ නම් ... | 8 00 |
| (බී) වෙළඳාමට හැර වෙනත් කටයුතු සඳහා පාවිච්චි කෙරේ නම් ... ... | 1 00 |
| ගොන් දෙදෙනා බැඳුනු සෑම බරකරත්තයක් සඳහා ... | 3 00 |
| තනි ගොනා බැඳුනු සෑම බරබාගයක් සඳහා ... | 2 00 |
| සෑම අත්කරත්තයක් සඳහා ... ... | 2 00 |
| සෑම රික්ෂෝවක් සඳහා ... ... | 2 00 |
| සෑම අශ්වයෙක්, පෝනියෙක් හෝ කොටළුවෙක් සඳහා | 2 50 |

11-826/2—65.11.19 දින අංක 14,561 දරන ගැසට් පත්‍රය.

---

## වලස්මුල්ල සුළු නගර සභාව

මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් අය විසින් 1966 වර්ෂයට එහි සඳහන් ස්ථානයෙහි මස් කඩයක් පවත්වාගෙන යාමට බලපත්‍රයක් ඉල්ලුම් කර ඇති බවත්, ඒ අනුව බලපත්‍රයක් නිකුත් කිරීම ගැන වලස්මුල්ල සුළු නගර සභා සීමාව තුළ පදිංචි යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම්, එසේ විරුද්ධ වීමට හේතු දක්වා පිටපත් දෙකකින් යුත් ලියවිල්ලක්, මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවූ දින සිට දින 14ක් ඇතුලත මා වෙත ලියා එවීමට බලය තිබෙන බවත්, මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ 201 වැනි පරිච්ඡේදයේ 1917 අංක 44 දරණ සංශෝධිත ආඥාපනතේ 6 වැනි වගන්තියෙන් සංශෝධිතය කරන ලද 7 වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම | වෙළඳාම | ස්ථානය |
|---|---|---|
| ඇම්. එච්. අබ්දුල් වාහිඩ් ... ... ... | එළ හරක් මස් ... | වලස්මුල්ල පොදු වෙළඳ පොලේ මස් කඩය |

ඇස්. ද. ඇස්. ලියනගේ,
වලස්මුල්ල සුළු නගර සභාවේ සභාපති.

1965 නොවැම්බර් මස 11 වැනි දින,
වලස්මුල්ල සුළු නගර සභා කාර්යාලයේදී ය.

11-847—65.11.19 දින අංක 14,561 දරන ගැසට් පත්‍රය

---

## කන්තලේ සුළු නගර සභාව

මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත (272 වැනි අධිකාරය)

මෙහි පහත සඳහන් උපලේඛනයේ දැක්වෙන අය විසින් මස් පිණිස සතුන් මරා විකිණීම සඳහා 1966 වර්ෂයට බලපත්‍ර ඉල්ලා කර තිබෙන බවත්, මෙම බලපත්‍ර නිකුත් කිරීමට විරුද්ධව කන්තලේ සුළු නගර සභා ප්‍රදේශය ඇතුළත පදිංචි සිටින කෙනෙකුට හෝ ඊ සඳහා විරුද්ධ වන්නේ දැයි විල් කරන නියායැයි දක්වෙන ලියවිල්ලක් පිටපත දෙකක සිටින මේ මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවන දින සිට දින 14 ක ඇතුළත මා වෙත ලියා එවීමට බලය තිබෙන බවත් මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ 272 වැනි අධිකාරයේ අංක 7 දරන වගන්තිය ප්‍රකාර මෙයින් දැනුම් දෙමි.

### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | වෙළඳාම | ස්ථානය |
|---|---|---|
| ඇම්. ඇම්. ඒ. රසාක්, පේරාතුවලි, කන්තලේ ... ... ... | හරක් මස් ... | පොදු වෙළඳපොලේ අංක 1 දරණ කඩ කාමරය |
| යූ. ඇම්. බුහාරි, මහ වීදිය, කන්තලේ ... ... ... | එළු මස් ... | පොදු වෙළඳපොලේ අංක 2 දරණ කඩ කාමරය |

එච්. බී. ඇල්. ලීලාරත්න,
සභාපති,
කන්තලේ සුළු නගර සභාව.

සුළු නගර සභා කාර්යාලය,
කන්තලේ,
1965, නොවැම්බර් මස 13 වැනි දින.

11—828—65.11.19 දින අංක 14,561 දරන ගැසට් පත්‍රය

## බෙලිඅත්ත සුළු නගර සභාව

### 1966 වර්ෂයට වරිපනම් බදු

1946 අංක 3 දරණ සුළු නගර සභා ආඥාපනත යටතේ, 1965 වර්ෂයට බලපවත්නා පහත සඳහන් වරිපනම් බදු 1966 වර්ෂයටද එලෙසම පැනවීමට බෙලිඅත්ත සුළු නගර සභාව තීරණය කර ඇති බව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ :—

"173 (1) වැනි වගන්තිය ප්‍රකාර මෙම නගර සභාව තුළ පිහිටා ඇති සියලුම නිශ්චල දේපලවල වාර්ෂික වටිනා කමින් සියයට තත (7) බැගින් වූ වාර්ෂික බද්ද, පිළිවෙලින් මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30, දෙසැම්බර් 31 වෙනිදාසින් අවසන් වන අයුරු කාර්තු හතරකට ගෙවිය හැකි අයුරිනි."

පී. එච්. සෝමදාස,
සභාපති,
සුළු නගර සභාව, බෙලිඅත්ත.

1965 නොවැම්බර් මස 5 වෙනි දින,
බෙලිඅත්තේ, සුළු නගර සභා කාර්යාලයේ දීය.

11–822—65.11.19 දින අංක 14,561 දරණ ගැසට් පත්‍රය

---

## රඹුක්කන සුළු නගර සභාව

### 1966 වර්ෂයට වරිපනම් බද්ද

සුළු නගර සභා ආඥාපනත (256 වැනි අධිකාරය) යටතේ ගතවියන මෙම වර්ෂයට බලපවත්නා පහත සඳහන් වරිපනම් බදු 1966 වර්ෂයටද එලෙසම පැනවීමට රඹුක්කන සුළු නගර සභාව තීරණය කර ඇති බව මෙයින් ප්‍රකාශනයට පත්කරනු ලැබේ.

159 (2) වැනි වගන්තිය ප්‍රකාර මෙම සුළු නගර සභා සීමාව තුළ පිහිටා තිබෙන සියලුම නිශ්චල දේපලවල වාර්ෂික වටිනාකමින් සියයට අට බැගින් වාර්ෂික බදු පිළිවෙලින් මාර්තු 31 වැනිදසින්, ජූනි 30 වැනිදසින්, සැප්තැම්බර 30 වැනිදසින් හා දෙසැම්බර 31 වැනිදසින් අවසන් වන අයුරු කාර්තු වශයෙන් ගෙවිය හැකිවේ.

මිලී කීර්තිරත්න,
සභාපතිනිය,
රඹුක්කන සුළු නගර සභාව.

1965 නොවැම්බර මස 9 වෙනි දින,
රඹුක්කන සුළු නගර සභා කායඝිලයේ දීය.

11–825—65.11.19 දින අංක 14,561 දරණ ගැසට් පත්‍රය

---

## පැල්මඩුල්ල සුළු නගර සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත (272 වෙනි අධිකාරය)

මෙහි පහත සඳහන් උපලේඛනයේ දැක්වෙන අය විසින් මස් විකිණීම සඳහා 1966 වර්ෂයට බලපත්‍ර ඉල්ලුම් කර තිබෙන බවත්, මෙම බලපත්‍ර නිකුත් කිරීමට විරුද්ධව පැල්මඩුල්ල සුළු නගර සභා ප්‍රදේශය ඇතුළත පදිංචි ඕනෑම කෙනෙකුට තවා ඒ සඳහා විරුද්ධ වන්නේ අසවල් කරුණ නිසා යයි දැක්වෙන ලියවිල්ලක් පිටපත් දෙකක් සිටිනසේ මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවන දින සිට දින 14ක් ඇතුළත මා වෙත ලියා එවීමට බලය තිබෙන බවත් මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ 272 වැනි අධිකාරයේ අංක 7 දරණ වගන්තිය ප්‍රකාර මෙයින් දැනුම් දෙමි.

#### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම | වෙළඳාම | ස්ථානය |
|---|---|---|
| 1. ඇස්. අයි. ඇම්. අබ්දුල් කාදර්, 13, මල්වල පාර, රත්නපුර ... | හරක් මස් සහ එළුමස් ... | පැල්මඩුල්ල තාවකාලික වෙළඳ පොළ |

ඒ. සී. ඇම්. ඒ. මරික්කාර්,
පැල්මඩුල්ල සුළුනගර සභාවේ සභාපති.

1965 නොවැම්බර් මස 6 දින,
පැල්මඩුල්ල සුළු නගර සභා කායඝිලයේ දීය.

11–813—65.11.19 දින අංක 14,561 දරණ ගැසට් පත්‍රය

---

## පුන්ඩලුඔය උප නගර සභාව

### 1966 වර්ෂය සඳහා රථවාහන සහ සතුන් පිළිබඳ බද්ද

පුන්ඩලුඔය උප නගර සභාව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලබන්නේ :—

(1) උප නගර සභා ආඥාපනතේ (256 වැනි අධිකාරය) 161 (1) වැනි වගන්තිය යටතේ පහත සඳහන් උපලේඛනයේ එම වාහන සහ සතුන් ඉදිරියෙන් සඳහන් කර තිබෙන ගණන් අනුව රථවාහන සහ සතුන් පිළිබඳ බද්දක් ගෙවිගෙන යන 1965 වර්ෂයට මෙන්ම 1966 වර්ෂයට ද පනවා ඇති බව හා,

(2) යථෝක්ත ආඥාපනතේ 162 (3) වැනි වගන්තිය යටතේ එකී බදු 1966 මාර්තු 31 වැනිදා හෝ ඊට පෙර ගෙවිය යුතු බවත් ය.

ඊ. පී. ඒ. ප්‍රාන්සිස් අප්පුහාමි,
සභාපති.

උප නගර සභා කායඝිලය,
පුන්ඩලුඔය,
65.11.

#### උපලේඛනය

| | රු. ශ. |
|---|---|
| මෝටර් කාර්, මෝටර් රෝදත්‍රයේ කාර්, ලොරි, මෝටර් පාපැදි, කරත්ත, අත්කරත්ත, රික්ෂෝ රථ, පාපැදි හෝ රෝදත්‍රයේ පාපැදි හැර වෙන ඕනෑම අන්දමක වාහනයක් සඳහා ... ... | 5 00 |
| සෑම පාපැදියක්, රෝදත්‍රයේ පාපැදියක් හෝ පාපැදි මෝටර් රථයක් හෝ කරත්තයක් නොහොත් රෝදත්‍රයේ පාපැදියක්, මෝටර් රථයක්, කරත්ත යක්— | |
| (ඒ) වෙළඳාම සඳහා පාවිච්චි කෙරේ නම් ... | 5 00 |
| (බී) වෙළඳාමට හැර වෙනත් කටයුතු සඳහා පාවිච්චි කෙරේ නම් ... ... | 1 00 |
| සෑම කරත්තයක් සඳහා ... ... | 4 00 |
| සෑම අත් කරත්තයක් සඳහා ... ... | 4 00 |
| සෑම ජින් රික්ෂෝවක් සඳහා ... ... | 2 50 |
| සෑම අශ්වයෙක්, පෝනියෙක් හෝ කොටලුවෙක් සඳහා | 5 00 |
| ඌරුවෙක් සඳහා ... ... ... | 1 00 |

11–793—65.11.19 දින අංක 14,561 දරණ ගැසට් පත්‍රය

---

## මාවනැල්ල සුළු නගර සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත දැක්වෙන උපලේඛනයෙහි සඳහන් අය විසින් මස් පිණිස සතුන් මරා විකිණීම සඳහා 1966 වර්ෂයට බලපත්‍ර ඉල්ලුම් කර තිබෙන බවත්, ඒ අනුව බලපත්‍ර නිකුත් කිරීම ගැන මාවනැල්ල සුළු නගර සභා ප්‍රදේශය තුල පදිංචි යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම්, එසේ විරුද්ධ වීමට ඇති හේතු සඳහන් කර, පිටපත් දෙකකින් යුත් ලියවිල්ලක් මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවූ දින සිට දින 14ක් ඇතුළත මා වෙත ලියා එවීමට බලය තිබෙන බවත් මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ, 201 වැනි පරිච්ඡේදයේ, 1947 අංක 44 දරණ සංශෝධිත ආඥාපනතේ 6 වෙනි වගන්තියෙන් සංශෝධනය කරන ලද 7 වෙනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

### උපලේඛනය

| | ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | වෙළඳාම කරන ස්ථානය | වෙළඳාම |
|---|---|---|---|
| 1. | එච්. ඇල්. ඇම්. ඉබ්‍රාහිම් මහතා, පල්ලිය පාර, කිරින්ගදෙණිය, මාවනැල්ල | අංක 123, කොළඹ–නුවර පාර, මාවනැල්ල | ... හරක් මස් |
| 2. | ඇම්. ඇල්. ඒ. හකීම් මහතා, හිඟුල ... | ... අංක 228, කොළඹ–නුවර පාර, හිඟුල ... | ... හරක් මස් |
| 3. | ඇම්. ඇස්. ඇම්. රෂීඩ් මහතා, දෙවෙනි හිඟුල්ඔය, මාවනැල්ල | ... අංක 336, කොළඹ–නුවර පාර, මාවනැල්ල | ... හරක් මස් |
| 4. | යූ. ඇල්. ඇම්. අබ්දුල් වාහිඩ් මහතා, ගල්කන්ද, මාවනැල්ල | ... අංක. 60, හිඟුල්ඔය පාර, මාවනැල්ල ... | ... හරක් මස් |
| 5. | යූ. ඇල්. ඇම්. කාසිම් මහතා, හිඟුල ... | ... අංක. 153, කඩවීදිය, හිඟුල ... | ... හරක් මස් |
| 6. | ඇම්. ඇල්. ඔමර් ලෙබ්බෙ මහතා, 338, කෙළින් වීදිය, මාවනැල්ල | අංක. 338, කොළඹ–නුවර පාර, මාවනැල්ල | ... හරක් මස් |
| 7. | එච්. ඇල්. ඒ. සමදු මහතා, පල්ලිය පාර, කිරින්ගදෙනිය, මාවනැල්ල | අංක 332, කොළඹ–නුවර පාර, මාවනැල්ල | ... එළු මස් |

ඒ. ඇල්. ඇම්. යූසුෆ්,
සභාපති.
මාවනැල්ල සුළු නගර සභාවේ සභාපති තැන.

1965 නොවැම්බර් මස 5 වැනි දින,
මාවනැල්ල සුළු නගර සභා කාර්යාලයේදී ය.

11–814—65.11.19 දින අංක 14,561 දරන ගැසට් පත්‍රය.

---

## අටුළුගම ගම්සභාව—දෙහිඕවිට

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත (272 අධිකාරය)

මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ (272 අධිකාරය) අංක 7 (2) (ඒ) සහ (බී) වගන්තිය යටතේ දැනුම් දීමයි.

මෙහි පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් නම් ඇති අය විසින් එහි සඳහන් ස්ථානයෙහි 1966 වර්ෂයට ගවයන් මරා මස් විකිණීමේ වෙළඳාමක් පවත්වා ගෙන යාම සඳහා බලපත්‍ර ඉල්ලුම් කර ඇති බවත්, මෙම බලපත්‍ර නිකුත් කිරීම ගැන–අටුළුගම ගම්සභා සීමාව තුළ පදිංචි ඔනෑම කෙනෙකුගේ විරුද්ධත්වයක් ඇත්නම්, එසේ විරුද්ධවීමට හේතු සඳහන් කර පිටපත් දෙකකින් යුතුව ලියවිල්ලකින්, මෙම දැනවීම ගැසට් පත්‍රයේ පළවන දින සිට දින 14ක් ඇතුලත මෙහි මා වෙත එවිය යුතු බව මෙයින් දැනුම් දෙමි.

### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | ස්ථානය හා පිහිටීම | වෙළඳාමේ ස්වභාවය |
|---|---|---|
| ඇස්. ඇල්. ඇම්. සමීන් ලෙබ්බෙ, අංක 86, ගරාගොඩ, යටියන්තොට. ... ... ... | ගරාගොඩ පිහිටි පැරණි දූව්රිය පාර ඉඩමේ, අංක 86 දරණ ස්ථානය. ... | ... ගවමස් කඩය |

ජේ. ඒ. පිටඩ,
සභාපති, අටුළුගම ගම්සභාව.

අටුළුගම ගම්සභාව,
දෙහිඕවිට,
1965.11.10.

11–794—65.11.19 දින අංක 14,561 දරන ගැසට් පත්‍රය.

---

## හාරිස්පත්තුව මැදසිය පත්තු ගම්ප්‍රදේශයේ ගම්සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත දැක්වෙන උපලේඛනයෙහි සඳහන් අය විසින් එහි සඳහන් ස්ථානයෙහි මස් පිණිස සතුන් මරා විකිණීම සඳහා 1966 වර්ෂය වෙනුවෙන් බල පත්‍ර ලබාගැනීමට අයදුම් පත්‍ර මා වෙත ඉදිරිපත් කර ඇති බවත්, මෙම බලපත්‍ර නිකුත් කිරීම ගැන හාරිස් පත්තුව මැදසිය පත්තු ගම් ප්‍රදේශය ඇතුළත පදිංචි කිසිවෙකු විරුද්ධ වන්නේනම්, ඔහු හෝ ඇය විරුද්ධ වීමට පසුවූ කාරණය නිසායයි දැක්වෙන ලියවිල්ලක් පිටපතක් සහිතව මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවන දින සිට දින 14ක් ඇතුළත මා වෙත දන්වා එවිය යුතු බවත්, මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපණතේ 272 වැනි පරිච්ඡේදයේ 7 වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

### උපලේඛනය

| | ඉල්ලුම්කරුගේ නම හා ලිපිනය | ස්ථානය | වෙළඳාම |
|---|---|---|---|
| 1. | එච්. ඇල්. ඒ. රහිම්, මුරුතලාව ... | ... කැරුඳුගොල්ලේ වැලිගොඩකන්ද ... | ... හරක් මස් |

ඇම්. පී. සයිමන්,
හාරිස්පත්තු මැදසිය පත්තුව ගම්සභාවේ සභාපති.

ගම්සභා කාර්යාලය,
අරඹේකඩේ,
කුඹුරේගම,
1965.11.5 වැනි දින.

11–816—65.11.19 දින අංක 14,561 දරන ගැසට් පත්‍රය.

## එගොඩපොත ගම්සභාව—කොළඹ දිස්ත්‍රික්කය

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත උපලේඛනයෙහි සඳහන් අය විසින් මස් පිණිස සතුන් මරා විකිණීම පිණිස 1966 වර්ෂයට බලපත්‍ර ඉල්ලුම්කර තිබෙන බවින්, එම බලපත්‍රය නිකුත් කිරීමට විරුද්ධවන කොළඹ දිස්ත්‍රික්කයේ එගොඩපොත ගම්සභා ප්‍රදේශය තුළ පදිංචි ඕනෑම කෙනෙකුට තමා ඒ සඳහා විරුද්ධ වන්නේ ඇයිදැයි කරුණු මනාව දක්වමින් ලියවිල්ලක් පිටපත් දෙකක් සහිතව මෙම දැන්වීම ගැසට් පත්‍රයෙහි පළවන දින සිට දින තුදුස (14) දවසක් ඇතුළත මා වෙත එවීමට බලය තිබෙන බවින් මස් පිණිස සතුන් මැරීම පිළිබඳ ආඥා පනතේ 201 වෙනි පරිච්ඡේදයේ අංක 7 දරණ 1947 අංක 44 දරණ ආඥාපනතින් සංශෝධනය වූ අංක 6 දරණ ආඥාපනත යටතේ දැනුම් දෙනු ලැබේ.

ඒ. ඩබ්ලිව්. ජී. සෙනෙවිරත්න,
එගොඩපොත ගම්සභාවේ සභාපතිතුමා,
සාමදාන විනිශ්චයකාරතුමා.

1965 ක් වූ නොවැම්බර් මස 10 වෙනි දින,
නිට්ටඹුවේ දීය.

### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | මස් කඩය පිහිටි ස්ථානය |
|---|---|
| 1. කේ. ඩැනියල් ප්‍රනාන්දු වැලිසර, රාගම. | නිට්ටඹුව හැඳිය අංක 1 හරක් සහ එළු මස් කඩය. |
| 2. ඊ. ඇම්. සැලි, බන්ඩාරනායක ජනපදය, නිට්ටඹුව. | නිට්ටඹුව හැඳිය අංක 2 හරක් සහ එළු මස් කඩය. |
| 3. පී. ඩී. සිරිපාල, නාලිගම, රාගම. | නිට්ටඹුව හැඳිය අංක 3 ඌරු මස් කඩය. |
| 4. ඇම්. අයි. ඇම්. සෙයිනුල් ආබිදීන්, කල් එළිය. | පස්යාල හරක් සහ එළු මස් කඩය. |
| 5. ඇම්. ඇස්. ඇම්. සම්සුදීන්, කල් එළිය. | කට්ටිල්පිටිය හරක් සහ එළු මස් කඩය. |

11-817—65.11.19 දින අංක 14,561 දරන ගැසට් පත්‍රය.

---

## රුවන්වැල්ල සුළු නගර සභාව—කෑගල්ල දිස්ත්‍රික්කය

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත දක්වෙන උප ලේඛනයෙහි සඳහන් අය විසින් 1966 වර්ෂයට මස් කඩයක් පවත්වාගෙන යාමට බල පත්‍රයක් ඉල්ලුම්කර සිටින බවින් ඒ අනුව බල පත්‍රයක් නිකුත්කිරීම ගැන රුවන්වැල්ල සුළු නගර සභා ප්‍රදේශය තුළ පදිංචි යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම් එයේ විරුද්ධවීමට හේතු දක්වා පිටපත් දෙකකින් යුත් ලියවිල්ලක් මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවූ දින සිට දින 14 ක් ඇතුළත මා වෙත ලියා එවීමට බලය තිබෙන බවින්, මස් මරන්නන් පිළිබඳ ආඥාපණතේ (201 වැනි ජෙදයේ) අංක 7 දරණ 1947 අංක 44 දරණ ආඥා පනතින් සංශෝධිතවූ අංක 6 දරණ ආඥා පනත යටතේ මෙයින් දනුම් දෙමි.

### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම | වෙළඳම | ස්ථානය |
|---|---|---|
| 1. ඇස්. ඇල්. ඇම්. සේනුදීන් ... ... | ... හරක් මස්, එළු මස් | ... රුවන්වැල්ල පාලම අසල අංක 1 කඩය |
| 2. වී. ඇම්. අබ්දුල් කාදර් ... ... ... | ... හරක් මස් | ... රුවන්වැල්ල පාලම අසල අංක 2 කඩය |
| 3. ඇස්. ඇල්. ඇම්. සේනුදීන් ... ... | ... හරක් මස්, එළු මස් | ... අඟුරුවැල්ල මස් කඩය |

සුළු නගර සභා කාර්යාලය,
රුවන්වැල්ල,
1965.11.10.

ඩී. ඇම්. හේමපාල,
සභාපති,
රුවන්වැල්ල සුළු නගර සභාවේ සභාපති.

11-818—65.11.19 දින අංක 14,561 දරන ගැසට් පත්‍රය.

---

මගේ අංකය : පී. 2.

## හැඳල සුළු නගර සභාව

### ගෝඝාතක ආඥාපනත

1947 අංක 44 දරණ ගෝඝාතක ආඥා පනතේ (සංශෝධිත) 6 ජෙදයෙන් සංශෝධිත වූ පරිදි, එම ආඥාපනතේ (201 වැනි පරිච්ඡේදය) 7 වැනි ජෙදය යටතේ කෙරෙන දනුම්දීමයි.

මෙහි පහත විස්තර කෙරෙන උප ලේඛණයේ සඳහන් අයවලුන් විසින් ඒ ඒ ස්ථානයෙහි මස්කඩවල මස් වෙළඳාම් පවත්වාගෙන යාම සඳහා 1966 වර්ෂයට බලපත්‍ර ඉල්ලුම්කර තිබෙන බවත්, පෙම බලපත්‍රය නිකුත්කිරීම ගැන හැඳල සුළු නගර සභා සීමාව තුළ පදිංචි ඕනෑම කෙනෙකු විරුද්ධ වන්නේ නම්, තම තමන්ගේ විරුද්ධත්ව ප්‍රකාශන එසේ විරුද්ධ වීමට හේතු සඳහන් කොට පිටපත් දෙක බැගින් යුතුව මෙම දන්වීම ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ වූ දින සිට දින දහහතරක් (14) ඇතුළත දී මා වෙත ඉදිරිපත් කරන ලෙසත් මෙයින් දනුම් දෙනුලැබේ.

### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | වෙළඳම | වෙළඳම කරන ස්ථානය |
|---|---|---|
| ඇම්. ඇස්. පෙරේරා, 158, හේකිත්ත, වත්තල | ... එළ හරක් මස්, එළු මස් සහ ඌරු මස් | ... හැඳල වෙල්ල මස් කඩය |
| ඇම්. ඇස්. පෙරේරා, 158, හේකිත්ත, වත්තල | ... එළ හරක් මස්, එළු මස් සහ ඌරු මස් | ... නායකකන්ද මස් කඩය |
| ඇම්. පැලිස්, 40, වැලිඅමුණ, වත්තල ... | ... එළ හරක් මස්, එළු මස් සහ ඌරු මස් | ... ඇලකන්ද හන්දියේ මස් කඩය |
| ජේ. ඩී. මිනුවෙල්, ඇලකන්ද පාර, මාටගොඩ, වත්තල | ... එළ හරක් මස්, එළු මස් සහ ඌරු මස් | ... ඇලකන්ද රා තැබෑරුම අසල මස් කඩය |
| කේ. ඒ. ෆොන්සේකා, 181, නිවිටිගස්යාය, වත්තල | ... එළ හරක් මස්, එළු මස් සහ ඌරු මස් | ... පල්ලියවත්ත පාලම අසල මස් කඩය |
| ඇම්. ඇස්. පෙරේරා, 158, හේකිත්ත, වත්තල | ... එළ හරක් මස්, එළු මස් සහ ඌරු මස් | ... හේකිත්ත හන්දියේ මස් කඩය |
| ඇම්. පැලිස්, 40, වැලිඅමුණ, නිවිටිගස්යාය, වත්තල | ... එළ හරක් මස්, එළු මස් සහ ඌරු මස් | ... වැලිඅමුණ මස් කඩය |

1965 නොවැම්බර් මස 10 වෙනි දින,
හැඳල සුළු නගර සභා කාර්යාලයේ දී.

ඩී. ඇස්. ගුණසේකර,
සභාපති,
හැඳල සුළු නගර සභාව.

11-819—65.11.19 දින අංක 14,561 දරන ගැසට් පත්‍රය.

## හෙට්ටිපොල ගමසභාව—කුරුණෑගල දිස්ත්‍රික්කය

### ගෝඝාතක ආඥපනත

මෙහි පහත උපලේඛනයේ නම් සඳහන් අය විසින් එහි සඳහන් ස්ථානයේදී 1966 වර්ෂයට මස් පිණිස සතුන් මරා මස් විකිණීම සඳහා බලපත්‍රයක් ඉල්ලා අයදුම් පතක් මාවෙත එවා තිබෙන බවත්, මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥපනතේ 201 වෙනි පරිච්ඡේදයේ 1947 අංක 44 දරණ සංශෝධිත ආඥපනතේ 6 වෙනි වගන්තිය සංශෝධනය කරන ලද 7 වෙනි වගන්තිය යටතේ මෙයින් දනුම් දෙමි.

එකී බලපත්‍ර නිකුත් කිරීම ගැන හෙට්ටිපොල ගම්ප්‍රදේශයේ ගමසීමාව තුළ පදිංචි යම්කෙනෙක් විරුද්ධත්වයක් ඇත්නම් ඔහු හෝ ඈ එයේ විරුද්ධ වන්නේ කුමන හේතු නිසාද යනවග සඳහන් ලියවිල්ලක් පිටපත් දෙකක් සහිතව මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවූ දින සිට දින 14ක් තුළදී මාවෙත එවිය යුතු බැව් මෙයින් දන්වා සිටිමි.

### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම | වෙළඳම් කරන ස්ථානය | වෙළඳම |
|---|---|---|
| පී. ඒ. අබුබක්කර් ... | ... දුම්මිදියාල නැමති ගමේ ගන්සූරියගහමුලවත්ත | ... එළහරක් මස් |

ඇම්. ඇල්. යූ. අහමදුලෙබ්බෙ,
හෙට්ටිපොල ගම සභාවේ සභාපති.

ගම්සභා කාර්යාලය,
හෙට්ටිපොල,
1965 නොවැම්බර් 9.

11–795—65.11.19 දින අංක 14,561 දරන ගැසට් පත්‍රය

---

## හාරිස්පත්තුව උඩගම්පහ ගම්සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥපනත

මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ 1947 තේ අංක 44 දරණ " සංශෝධිත " ආඥපණතේ 6 වැනි වගන්තියෙන් සංශෝධිත, 272 පරිච්ඡේදයේ අංක 7 " 2 " " ඒ " සහ " බී " වගන්තිය යටතේ දනුම්දීමයි.

මෙහි පහත දක්වෙන උපලේඛණයේ නම් සඳහන් අයවලුන් විසින් එහි දක්වෙන ස්ථානයන්හි 1966 වර්ෂයට මස්කඩ පවත්වා ගෙන යාම සඳහා බලපත්‍ර ඉල්ලුම්කර ඇති බවත්, මෙම බලපත්‍ර නිකුත්කිරීම ගැන මහනුවර දිස්ත්‍රික්කයේ හාරිස්පත්තුව උඩගම්පහ ගම්සභා සීමාව තුළ පදිංචි කිසියම් කෙනෙකුගේ විරුද්ධත්වයක් ඇත්නම් එය විස්තර සහිතව ලියවිල්ලකින් පිටපත් දෙකක් සිටින සේ සකස්කොට මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවූ දින සිට දින 14 ක් ඇතුළත මා වෙත ලැබෙන්නට සැලැස්විය යුතු බැව් මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ සංශෝධිත ආඥපණතේ 272 වෙනි පරිච්ඡේදයේ 7 වැනි වගන්තිය යටතේ මෙයින් දනුම්දෙමි.

### උපලේඛනය

| | ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | වෙළඳම | ස්ථානය |
|---|---|---|---|
| 1. | එච්. ඇම්. එස්. ආබ්දීන්, අංක 10, දුනුවිල පාර, අකුරණ ... ... | හරක් මස් ... | අංක 10, දුනුවිල පාර, අකුරණ |
| 2. | ඩී. ඇන්. අහමඩ්, අංක 59, මාතලේ පාර, අකුරණ ... ... ... | හරක් මස් ... | අංක 59, මාතලේ පාර, අකුරණ |
| 3. | ඇන්. අබ්දුල් කාදර්, අංක 195, කුරුගොඩ, අකුරණ ... ... ... | හරක් මස් ... | අංක 195, මාතලේ පාර, අකුරණ |
| 4. | ටී. එම්. එච්. ලෙබ්බෙ, අංක 61, දුනුවිල පාර, අකුරණ ... ... ... | හරක් මස් ... | අංක 61, දුනුවිල පාර, අකුරණ |
| 5. | ඇම්. ඇස්. ඒ. මොහමඩ්, අංක 422, වරාගස්හින්න, අකුරණ ... ... | හරක් මස් ... | අංක 62ඒ, අකුරණ |
| 6. | ඇන්. ඒ. සම්සුදීන්, අංක 50, අකුරණ ... ... ... ... | හරක් මස් ... | අංක 50, අකුරණ |
| 7. | ඇන්. ඒ. ලතීෆ්, අංක 65, අකුරණ ... ... ... ... | හරක් මස් ... | අංක 65, අකුරණ |
| 8. | ටී. එම්. එච්. ලෙබ්බෙ, අංක 92, අකුරණ ... ... ... | එළුමස් ... | අංක 92, අකුරණ |
| 9. | ඩී. ඇන්. අහමඩ්, අංක 59, අකුරණ ... ... ... ... | එළු මස් ... | අංක 59, අකුරණ |
| 10. | එච්. ඇම්. ඒ. කාදර්, අංක 61, අකුරණ ... ... ... ... | හරක් මස් ... | අංක 61, අකුරණ |

ගමසභා කාර්යාලය,
අලවතුගොඩ,
65.11.5.

එච්. ඇම්. ඩබ්ලිව්. විකිරමබණ්ඩා,
සභාපති,
හාරිස්පත්තුව උඩගම්පහ ගම්සභාව.

11-834—65.11.19 දින අංක 14,561 දරන ගැසට් පත්‍රය

---

## පනාවල් කෝරළේ (නැගෙනහිර හා බටහිර) ගම්සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥපනත

මෙහි පහත උපලේඛණයේ නම් සඳහන් අය එහි සඳහන් ස්ථානයන්හි 1966 වර්ෂයට මස් පිණිස සතුන් මරා විකිණීම සඳහා බලපත්‍ර ඉල්ලා අයදුම් පත් මා වෙත එවා තිබෙන බවත් මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥපණතේ (272 වැනි අධිකාරය) 7 වැනි වගන්තිය යටතේ මෙයින් දනුම්දෙනු ලැබේ.

2. එකී බලපත්‍ර නිකුත්කිරීම ගැන පනාවල් කෝරළේ ගම්සභා සීමාව තුල පදිංචි යම් කෙනෙකු විරුද්ධවන්නේ නම් ඔහු හෝ ඈ විරුද්ධවන්නේ කුමන හේතුන් නිසාද යනවග සඳහන් ලියවිල්ලක් පිටපතක් සහිතව මෙම දන්වීම ගැසට් පත්‍රයේ පලවූ දින සිට දින 14 ක් ඇතුලත මා වෙත එවියයුතු බව මෙයින් දන්වා සිටිමි.

1965 නොවැම්බර් මස 5 වැනි දින,
පනාවල, ගම්සභා කාර්‍යාලයේදීය.

ආර්. ඇම්. පුදියන්සේ,
පනාවල් කෝරළේ (නැ. හා බ.)
ගම්සභාවේ සභාපතිතුමා.

### උපලේඛනය

| | ඉල්ලුම්කරුගේ නම | ස්ථානය | වෙළඳම |
|---|---|---|---|
| 1. | ඇම්. ඇල්. ඇම්. ඉසාක්, විලේගොඩ, ඇහැළියගොඩ ... ... | අංක 30 බී, කැන්දන්ගමුව ... | ... හරක් මස් |
| 2. | ඇස්. ඇම්. ලතිප්, විලේගොඩ, ඇහැළියගොඩ ... ... | අංක 30 සී, කැන්දන්ගමුව ... | ... එළු මස් |
| 3. | ඩී. ඇල්. ඇම්. සහිඩ්, ඇහැළියගොඩ ... ... ... | බෙන්දඑව, පරකඩුව ... | ... හරක් මස් |
| 4. | ඩී. ඇල්. ඇම්. සහිඩ්, ඇහැළියගොඩ ... ... ... | ජම්බුගස්වත්ත, තලගහමුල, ඇහැළියගොඩ | ... හරක් මස් |
| 5. | ඉෂඩ්. ඇම්. ඇම්. ෂරීප්, විලේගොඩ, ඇහැළියගොඩ ... ... | රිච්ගිරිගෙවත්ත, අස්ගඟුල, ඇහැළියගොඩ | ... හරක් මස් |
| 6. | ඉෂඩ්. ඇම්. ඇම්. ෂරීප්, විලේගොඩ, ඇහැළියගොඩ ... ... | තේක්කවත්ත, කඹිඅඩිය, පනාව | ... හරක් මස් |

11-835—65.11.19 දින අංක 14,561 දරන ගැසට් පත්‍රය

## මහර ගම්සභාව

මෙහි පහත උපලේඛනයෙහි සඳහන් ස්ථානවල 1966 යේ වර්ෂයට මස් පිණිස සතුන් මරා විකිණීමට බලපත්‍ර ඉල්ලා අයදුම් පත් මා වෙත ඉදිරිපත් කර ඇති බව මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ 201 පරිච්ඡේදයේ 1947 අංක 44 දරන සංශෝධිත ආඥාපනතේ 6 වැනි වගන්තියෙන් සංශෝධනය කරන ලද 7 වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

2. එකී බලපත්‍ර නිකුත් කිරීම ගැන මහර ගම්සභා සීමාව තුළ පදිංචි යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම්, ඔහු හෝ ඈ එසේ විරුද්ධ වන්නේ කුමන හේතුන් නිසාද යන වග සඳහන් ලියවිල්ලක් පිට පතක් සහිතව මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවූ දින සිට 14 දිනක් ඇතුළත මා වෙත එවිය යුතු බව මෙයින් දන්වා සිටිමි.

### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | ස්ථානය |
|---|---|
| 1. ඇම්. ඩී. ඩේවිඩ්, දළුපිටිය, කඩවත. | මහර හන්දියේ පිහිටි හරක් මස් කඩය. |
| 2. ජේ. ඩී. ඇන්ටනි, දළුපිටිය, කඩවත. | අක්බාර් වත්තේ පිහිටි හරක් මස් කඩය. |
| 3. ආර්. පී. වික්‍රමසිංහ, 285, එඬේරමුල්ල, වත්තල. ... | එඬේරමුල්ලේ පිහිටි හරක් මස් කඩය. |
| 4. ජේ. ඩී. ඇන්ටනි, දළුපිටිය, කඩවත. | දළුපිටිය හන්දියේ පිහිටි හරක් මස් කඩය. |
| 5. ජේ. ඩී. ඇන්ටනි, දළුපිටිය, කඩවත. | මහරනුගේගොඩ පිහිටි හරක් මස් කඩය. |
| 6. ජේ. ඩී. ඇන්ටනි, දළුපිටිය, කඩවත. | කුරුකුලාව පිහිටි හරක් මස් කඩය. |
| 7. ජේ. ඩී. ඇන්ටනි, දළුපිටිය, කඩවත. | පහළකරගහමුණ පිහිටි හරක් මස් කඩය. |

කමලවර්ණ කුමාරසිංහ ජයකොඩි,
මහර ගම් සභාවේ ප්‍රධාන තැනැ.

ගම්සභා කාර්යාලය,
කුරුකුලාව, රාගම,
1965. 11. 10 දින දිය.

11-842—65.11.19 දින අංක 14,561 දරණ ගැසට් පත්‍රය

---

## ගාළු දිස්ත්‍රික්කයේ බෝපේ ගම් ප්‍රදේශයේ ගම් සභාව

**මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත**

මෙහි පහත උපලේඛනයේ සඳහන් අය එහි සඳහන් ස්ථානවල 1966 වර්ෂයට මස්කඩ පවත්වා ගෙන යාමට බලපත්‍ර ඉල්ලුම් කර තිබෙන බවත් මෙම බලපත්‍ර නිකුත් කිරීම ගැන ගාළු දිස්ත්‍රික්කයේ බෝපේ ගම් සභා ප්‍රදේශය තුළ පදිංචි යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම් ඒ කුමන කරුණක් නිසාද යන වග ඇතුළත් ලියවිල්ලක් පිටපත් දෙකක් සහිතව මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවන දිනය සිට සති දෙකක් ඇතුළත ලියා එවීමට බලය තිබෙන බවත් මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ 201 වෙනි පරිච්ඡේදයේ අංක 7 දරන 1947 අංක 44 දරණ පනතින් සංශෝධිත වූ අංක 6 දරණ ආඥාපනත යටතේ මෙයින් දනුම් දෙමි.

### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම | ස්ථානය |
|---|---|
| 1. ඇම්. අයි. ඇම්. සම්සුදීන් ... | කිතුලම්පිටිය, කහඳුව වත්ත හන්දියේ කිරියටකිඹිවිට නැමැති ඉඩමේ තිබෙන හරක් මස් සහ එළුමස් කඩය. |
| 2. එම්. සී. ඒ. ඉස්මයිල් ... | ගිංතොට, කුරුඳුවත්තේ පිහිටි කුරුඳුවත්ත නමැති ඉඩමේ නො. 1 දරණ කැබෙල්ලේ තිබෙන මස් කඩය. |
| 3. ඊ. ඇම්. එසියා ... | ගිංතොට, වැලිපිටිමෝදර තිබෙන හරක් මස් සහ එළුමස් කඩය. |

ජේ. පී. සෙනෙවිරත්න,
බෝපේ ගම් ප්‍රදේශයේ ගම් සභාවේ සභාපති.

ගම් සභා කාර්යාලය, කලේගාන, ගාල්ල,
1965 ක්වූ නොවැම්බර් මස 6 වෙනි දින.

11-846—65.11.19 දින අංක 14,561 දරණ ගැසට් පත්‍රය

---

## අහංගම සුළු නගර සභාව

**1966 අවුරුද්දට වරිපනම් බද්ද**

1946යේ අංක 3 දරණ සුළු නගර සභා ආඥාපනත යටතේ, මෙම ගතවී යන අවුරුද්දට බලපවත්නා පහත සඳහන් වරිපනම් බදු 1966 වර්ෂයටද එලෙසම පැනවීමට, අහංගම සුළු නගර සභාව තීරණය කර ඇති බව මෙයින් ප්‍රකාශයට පත්කරනු ලබන්නේ—

159 වැනි වගන්තිය ප්‍රකාර, මෙම සුළු නගර සභාව, තුළ පිහිටා තිබෙන කුඹුරු හා වාර්ෂික වටිනාකම රුපියල් 75 ට අඩු නිශ්චල දේපොළ හැර අන් සියළුම නිශ්චල දේපොලවල වාර්ෂික වටිනාකමින් සියයට හය (6) බැගින්වූ වාර්ෂික බද්ද, පිළිවෙලින් ජූනි මස 30 වැනිදාසින් හා දෙසැම්බර් මස 31 වැනිදාසින් අවසන් වන අයුරු අර්ධ වාර්ෂිකව ගෙවිය හැකි අයුරිනි.

ඡ. නන්දිපාල,
සභාපති, අහංගම සුළු නගර සභාව.

1965ක්වූ නොවැම්බර් මස 12 වැනි දින,
අහංගම සුළු නගර සභා කාර්යාලයේදීය.

11-852/1—65.11.19 දින අංක 14,561 දරණ ගැසට් පත්‍රය

---

## අහංගම සුළු නගර සභාව

**1966 අවුරුද්දට සුනඛ බද්ද**

### සුනඛයින් ලියාපදිංචි කිරීමේ ආඥාපනත (334 වැනි පරිච්ඡේදය)

සුනඛයින් ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ (334 වැනි පරිච්ඡේදය) 4 වැනි වගන්තිය යටතේ මෙම සුළු නගර සභා බල සීමාවලය තුළ තබාගෙන සිටින සෑම බල්ලෙකු සහ බැල්ලියක් වෙනුවෙන් රුපියල් 1ක් ලියාපදිංචි කිරීමේ ගාස්තු වශයෙන් 1966 වර්ෂයට පනවා ඇති බවද, එකී ගාස්තු 1966 මාර්තු මස 31 වැනි දින හෝ ඊට පෙර ගෙවිය යුතු බවද අහංගම සුළු නගර සභාව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ඡ. නන්දිපාල,
සභාපති, අහංගම සුළු නගර සභාව.

1965ක්වූ නොවැම්බර් මස 12 වැනි දින,
අහංගම සුළු නගර සභා කාර්යාලයේදීය.

11-852/2—65.11.19 දින අංක 14,561 දරණ ගැසට් පත්‍රය

## අහංගම සුළු නගර සභාව

### 1966 අවුරුද්ද සඳහා රථවාහන සහ සතුන් පිළිබඳ බද්ද

1946 අංක 3 දරණ සුළු නගර සභා ආඥාපනතේ 161 වෙනි වගන්තිය යටතේ පහත සඳහන් උපලේඛනයෙහි නම් කරන ලද රථවාහන සහ සතුන්ට ඒ ලේඛනයෙහි එම වාහන හා සතුන් ඉදිරියෙන් සඳහන් කර තිබෙන බදු ගාස්තු පසුගිය වර්ෂයට මෙන්ම 1966 වර්ෂයටද පනවා ඇති බවත්,

(2) යථෝක්ත ආඥාපනතේ 162 (3) වෙනි වගන්තිය යටතේ එකී බදු, 1966 මාර්තු මස 31 වෙනි දින හෝ ඊට පෙර ගෙවිය යුතු බවත්, අහංගම සුළු නගර සභාව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ඉ. නන්දිපාල,
සභාපති, අහංගම සුළු නගර සභාව.

1965ක්වූ නොවැම්බර් මස 12 වැනි දින,
අහංගම සුළු නගර සභා කාර්යාලයේදීය.

## උපලේඛනය

| | රු. | ශ. |
|---|---|---|
| මෝටර් කාර්, මෝටර් රෝදත්‍රයේ කාර්, ලොරි, මෝටර් පා පැදි, කරත්ත, අත්කරත්ත, ජින් රික්ෂෝ රථ, පා පැදි හෝ රෝදත්‍රයේ පා පැදි හැර වෙනයම් ඕනෑම වාහනයක් සඳහා ... ... | 5 | 0 |
| ඕනෑම පා පැදියක්, රෝදත්‍රයේ පා පැදියක් හෝ පා පැදි මෝටර් රථයක් හෝ කරත්තයක් නොහොත් රෝදත්‍රයේ පා පැදියක් හෝ මෝටර් රථයක් හෝ කරත්තයක්— | | |
| (අ) වෙළඳ කාර්යයන් සඳහා පාවිච්චි කෙරේ නම් ... ... ... | 5 | 0 |
| (ආ) වෙළඳ කාර්යයන් හැර වෙන ඕනෑම කටයුත්තකට පාවිච්චි කෙරේ නම් ... | 1 | 0 |
| ඕනෑම අන්දමක ගොන් දෙන්නා බඳින බර කරත්තයකට හෝ තිරික්කලයකට ... | 4 | 0 |
| ඕනෑම අන්දමක තනි ගොනා බඳින කරත්තයකට හෝ තිරික්කලයකට ... ... | 3 | 0 |
| ඕනෑම අත්කරත්තයකට ... ... | 2 | 50 |
| ඕනෑම ජින් රික්ෂෝ රථයකට ... ... | 2 | 50 |
| ඕනෑම අශ්වයෙකුට, අශ්වතරයෙකුට හෝ කොටළුවෙකුට | 5 | 0 |
| ඕනෑම බූරුවෙකුට ... ... ... | 1 | 0 |

11-852/3—65.11.19 දින අංක 14,561 දරන ගැසට් පත්‍රය

සෑම සිකුරාදා දිනයකම ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට වැටෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

ගැසට් පත්‍රය පළ කරන දින සිට කාර්යාලය වැඩ කරන දින හතරකට ප්‍රථම පස්වරු 3.30 ට සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති හට ලැබෙන සේ එවිය යුතුයි (සාමාන්‍ය වශයෙන් සඳුදා පස්වරු 3.30 ට ප්‍රථමයෙන්).

ගැසට් පත්‍රය ලබාගැනීම සඳහා දයක මුදල් කොළඹ, මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙලින්ම යැවිය යුතුය. ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දයක මුදල් භාරගනු නොලැබේ.

ලංකාවේ වැලිවේරියෙහි පිහිටි "රිස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන්" හි නිපදවන ලද කඩදාසිවල
ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රිතයි.